PGIHS
UNIVERSITY OF PERADENIYA

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT
# 2023

# ANNUAL REPORT

POSTGRADUATE INSTITUTE OF HUMANITIES AND SOCIAL SCIENCES



මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
மானிடவியல் மற்றும் சமுக விஞ்ஞானப்பட்டப்பின் படிப்பு நிறுவகம
பேராதனைப் பல்கலைக்கழகம்
**Postgraduate Institute of Humanities and Social Sciences**
**University of Peradeniya**

## දැක්ම

ශ්‍රී ලංකාවේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි අධ්‍යාපනය, පර්යේෂණ සහ තාර්කික චින්තනයේ ප්‍රමුඛයා වීම හා කලාපයේ ඉගෙනුම් කටයුතු පිළිබඳ විශිෂ්ටතා කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම.

## මෙහෙවර

තම අධ්‍යයන ක්ෂේත්‍රයන්ට අදාළ දැනුම, කුසලතා සහ නිපුණතාවලින් පරිපූර්ණවූ විද්වතුන්, පර්යේෂකයන් සහ වෘත්තිකයන් බිහි කිරීමේ අරමුණැතිව උසස් තත්ත්වයේ පශ්චාත් උපාධි අධ්‍යාපනයක් ලබා දීම.

## අරමුණු හා පරමාර්ථ

- අධ්‍යයන අවස්ථා සඳහා ප්‍රවේශතාවය, ගුණාත්මකභාවය සහ අදාළත්වය වැඩි දියුණු කිරීම.
- අන්‍යෝන්‍ය ගෞරවය, සමාජ සංවේදීතාව, ගුණාත්මක ශිෂ්‍යත්ව සහ වෘත්තීයභාවය මත පදනම් වූ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම
- ක්‍රියාකාරී පර්යේෂණ සංස්කෘතියක් සහ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා වූ කාර්යක්ෂම පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම
- භෞතික යටිතල පහසුකම් සහ සේවා පහසුකම් සංවර්ධනය කිරීම
- පරිපාලනයේ කාර්යක්ෂමතාව සහ මූල්‍ය කළමනාකරණයේ තිරසාරභාවය ළඟා කර ගැනීම
- ආයතනයේ සියලු කටයුතුවලදී පාරදෘෂ්‍යභාවය සහ යහපාලනය තහවුරු කිරීම

| පටුන | පිටු අංක |
| --- | --- |


| | | |
| --- | --- | --- |
| ආයතනයේ සංවිධානාත්මක ව්‍යුහය | | 2 |
| කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය | | 3 |
| 1 වන කොටස: | 2023 වර්ෂය සඳහා ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ ප්‍රකාශය/සමාලෝචනය | 5 |
| 2 වන කොටස: | ආයතනයේ පසුබිම | 7 |
| 3 වන කොටස: | ශිෂ්‍ය බඳවාගැනීම් | 9 |
| 4 වන කොටස: | විදේශීය ශිෂ්‍ය බඳවාගැනීම් | 13 |
| 5 වන කොටස: | වැඩසටහන සම්පූර්ණ කිරීම | 14 |
| 6 වන කොටස: | අධ්‍යයන කාර්යමණ්ඩලය | 14 |
| 7 වන කොටස: | සේවක වර්ගීකරණය | 16 |
| 8 වන කොටස: | පර්යේෂණ ප්‍රකාශන සහ ඉදිරිපත්කිරීම් | 17 |
| 9 වන කොටස: | පුහුණුසැසි සහ වැඩමුළු | 22 |
| 10 වන කොට: | උපාධි ප්‍රදානෝත්සවය සහ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය | 22 |
| 11 වන කොටස: | විදේශීය/දේශීය සහයෝගීතා | 23 |
| 12 වන කොටස: | තිරසරසංවර්ධනය මත පදනම්ව සාක්ෂාත්කරගැනීමට අපේක්ෂිත ඉලක්ක පිළිබඳ වාර්තා | 25 |
| 13 වන කොටස: | සාමාන්‍ය පරිපාලනය | 25 |
| 14 වන කොටස: | 2023 වර්ෂයේ ආයතනයේ මූල්‍ය කාර්යසාධනය | 26 |
| 15 වන කොටස: | සබ්‍යතා සහ අපේක්ෂාවන් | 28 |
| 16 වන කොටස: | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන-2023 | 29 |
| 17 වන කොටස: | 2023 වර්ෂය සඳහා වන විගණකාධිපතිවරයාගේ වාර්තාව | 59 |
| 18 වන කොටස: | විගණකවරයාගේ වාර්තාව සඳහා ආයතනය විසින්ලබා දුන්පිළිතුරු | 66 |

# සංවිධාන ව්‍යුහය



වි.වි.ප්‍ර.කො.
පාලක සභාව
සනාතන සභාව
අධ්‍යක්ෂ
කළමනාකරණ මණ්ඩලය
අභ්‍යන්තර සහ රජයේ විගණන අංශ
පරිපාලනා කළමනාකරණ කාර්යාලය
අධ්‍යයන මණ්ඩලය
මූල්‍ය කළමනාකරණ කාර්යාලය
අධ්‍යයන වැඩසටහන් කළමනාකරණ කාර්යාලය

## කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය
**(2023 දෙසැම්බර් 31 දිනට)**

| අනු අංකය | සාමාජිකයාගේනම | අනුබද්ධ ආයතනය | සාමාජිකත්වය |
|---|---|---|---|
| 1 | මහාචාර්ය එස්.ජේ.එස්. දමෙල් | අධ්‍යක්ෂ/ මා.ශා.හාස.විද්‍යා පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය | නිල බලයෙන් පත්වූ (සභාපති) |
| 2 | ආචාර්ය ඊ.එම්.පී.සී.එස්. ඒකනායක | පීඨාධිපති/ ශාස්ත්‍රපීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් පත්වූ |
| 3 | මහාචාර්ය එස්.ආර්. කොඩිතුවක්කු | පීඨාධිපති/ විද්‍යාපීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් පත්වූ |
| 4 | මහාචාර්ය කේ.ඒ.එස්.එස්. කොඩිතුවක්කු | පීඨාධිපති/ කෘෂිකර්මපීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් පත්වූ |
| 5 | ඩබ්ලිව්.කේ.එල්.ඊ. වලල්ලාවිට මහතා | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | නම් කරන ලද |
| 6 | එච්.සමරසිංහ මිය | මුදල් අමාත්‍යාංශය | නම් කරන ලද |
| 7 | අධ්‍යක්ෂක | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යාපන සඳහාවූ ජාතික මධ්‍යස්ථානය | නිල බලයෙන් පත්වූ |
| 8 | අධ්‍යක්ෂ / පර්යේෂණ | පේරාදෙණිය විශ්වවිද්‍යාලය (තනතුර දැනට නොමැත) | නිල බලයෙන් පත්වූ |
| 9 | එම්.ඒ.එම්. යසීර් | අංශ ප්‍රධානී, අරාබි සහ ඉස්ලාමීය ශිෂ්ටාචාර අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. | නිල බලයෙන් පත්වූ |
| 10 | මහාචාර්ය ජේ.එම්.ඒ. ජයවික්‍රම | අංශ ප්‍රධානී, පුරා විද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. | නිල බලයෙන් පත්වූ |
| 11 | කේ.එම්.ආර්.එන්. කුලතුංග මිය | අංශ ප්‍රධානී, සම්භාව්‍යභාෂා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. | නිල බලයෙන් පත්වූ |
| 12 | මහාචාර්ය ජේ. ජී. ශ්‍රී රංජිත් | අංශ ප්‍රධානී, ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. | නිල බලයෙන් පත්වූ |
| 13 | ආචාර්ය කේ.එස්.එච්.එම්.වී.ඩබ්.ඩබ්.සෙනෙවිරත්න | අංශ ප්‍රධානී, අධ්‍යාපන අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. | නිල බලයෙන් පත්වූ |
| 14 | ආචාර්ය එම්. කළුගම්පිටිය | අංශ ප්‍රධානී, ඉංග්‍රීසි අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. | නිල බලයෙන් පත්වූ |
| 15 | මහාචාර්ය ඩබ්ලිව්. එම්. පී. එස් බණ්ඩාර | අංශ ප්‍රධානී, ලලිත කලා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. | නිල බලයෙන් පත්වූ |
| 16 | මහාචාර්ය ටී.ඩබ්ලිව්. එම්. ටී. ඩබ්ලිව් බණ්ඩාර | අංශ ප්‍රධානී, භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. | නිල බලයෙන් පත්වූ |
| 17 | ආචාර්ය කේ.එම්.ආර්. දසනායක | අංශ ප්‍රධානී, ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. | නිල බලයෙන් පත්වූ |
| 18 | ආචාර්ය කේ. සෙනෙවිරත්න | අංශ ප්‍රධානී, නීති අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. | නිල බලයෙන් පත්වූ |
| 19 | මහාචාර්ය එච්. එම්. එම් හේරත් | අංශ ප්‍රධානී, පාලි සහ බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. | නිල බලයෙන් පත්වූ |
| 20 | ආචාර්ය එච්. ආර්. එන්. පී. කේ හඳගම | අංශ ප්‍රධානී, දර්ශන අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. | නිල බලයෙන් පත්වූ |
| 21 | මහාචාර්ය ජී.ඩී.ආර්.යූ.යූ.අබේරත්න | අංශ ප්‍රධානී, දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. | නිල බලයෙන් පත්වූ |
| 22 | ආචාර්ය එස්.කේ.එම්.ඩී.ඩී. ගුණතිලක | අංශ ප්‍රධානී, සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. | නිල බලයෙන් පත්වූ |
| 23 | ආචාර්ය ඩබ්ලිව්.එම්.එස්.එම්.කේ. තෝරදෙණිය | අංශ ප්‍රධානී, සමාජ විද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. | නිල බලයෙන් පත්වූ |

| | | | |
|---|---|---|---|
| 24 | මහාචාර්ය එස්.පිරශාන්තන් | අංශ ප්‍රධානී, දෙමළ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. | නිල බලයෙන් පත්වූ |
| 25 | ආචාර්ය බී.ඩී.ඒ.ඩී.එන් බුලත්වත්ත | අංශ ප්‍රධානී, මනෝ විද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. | නිල බලයෙන් පත්වූ |
| 26 | මහාචාර්ය එස්. යටිගම්මන | අංශ ප්‍රධානී, තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. | නිල බලයෙන් පත්වූ |
| 27 | මහාචාර්ය පි. ආර්. කේ. ඒ. විතාරණ | අංශ ප්‍රධානී, ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. | නිල බලයෙන් පත්වූ |
| 28 | මහාචාර්ය ඒ.සර්ජුන් | සභාපති, සමාජ විද්‍යා අධ්‍යයන මණ්ඩලය | නිල බලයෙන් පත්වූ |
| 29 | ආචාර්ය ඩබ්ලිව්.ඩී.එස්.කේ. ප්‍රේමසිරි | සභාපති, භාෂා සහ සාහිත්‍ය අධ්‍යයන මණ්ඩලය | නිල බලයෙන් පත්වූ |
| 30 | ආචාර්ය එස්.එස්.කේ.බී.එම්. දොරබාවිල | සභාපති ,ආර්ථික විද්‍යාව සහ කළමනාකරණ අධ්‍යයන මණ්ඩලය | නිල බලයෙන් පත්වූ |
| 31 | මහාචාර්ය පී.සේතුංග | සභාපති , මනෝ විද්‍යාව, දර්ශනය සහ අධ්‍යාපනය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය | නිල බලයෙන් පත්වූ |
| 32 | මහාචාර්ය එම්.ඥාණානන්ද හිමි | සභාපති,ආගමික හා සංස්කෘතික අධ්‍යයන මණ්ඩලය | නිල බලයෙන් පත්වූ |
| 33 | ආචාර්ය වී.නානායක්කාර | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජික | පත්කරනලද |
| 34 | ආචාර්ය ජේ.එම් ගුණදාස | ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරන ලද සාමාජික | පත්කරනලද |
| 35 | මහාචාර්ය පී.ඩී. ප්‍රේමසිරි | ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරන ලද සාමාජික | පත්කරනලද |
| 36 | මහාචාර්ය කේ.ටී. සිල්වා | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජික | පත්කරනලද |

## 1 වන කොටස 2023 වර්ෂය සඳහා ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ ප්‍රකාශය /සමාලෝචනය



මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වනාහි මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයන්හි උසස් අධ්‍යාපනය සහ පුහුණුව ලබා දීම සහ එම ක්ෂේත්‍රයන්හි පර්යේෂණ වැඩිදියුණු කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24A වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ආඥා පනතක් මගින් 2014 වසරේදී උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ස්ථාපිත කරන ලද ආයතනයකි. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයන්හි අධ්‍යාපනය, පර්යේෂණ සහ නිර්මාණාත්මක චින්තනයෙහි විශිෂ්ටතා කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම සහ සමාජයීය සංවේදීතාවයකින් යුතු තාර්කික සහ ස්වාධීන චින්තනය තුළින් දැනුම වර්ධනය කිරීමට කැපවූ විද්වතුන්, පර්යේෂකයන් සහ වෘත්තිකයන් බිහි කිරීම මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අරමුණ වේ.

වර්තමානයේ මෙම ආයතනය විසින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාලාවන්, පාඨමාලා මගින් පිරිනමන ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් , පාඨමාලා සහ පර්යේෂණ මගින් පිරිනමන ශාස්ත්‍රපති උපාධි පාඨමාලා සහ දර්ශනපති සහ දර්ශනසූරි වැනි පර්යේෂණ උපාධි පාඨමාලා පවත්වනු ලබයි. මෙහි විෂය ක්ෂේත්‍රයන්ට අරාබි, පුරාවිද්‍යාව, බෞද්ධ අධ්‍යයනය, ආර්ථික විද්‍යාව/ව්‍යවහාරික ආර්ථික විද්‍යාව, අධ්‍යාපනය, ඉංග්‍රීසි, ලලිත කලා, භූගෝල විද්‍යාව, ග්‍රීක සහ රෝම අධ්‍යයනය, හින්දු ශිෂ්ටාචාරය, ඉතිහාසය, ඉස්ලාමීය අධ්‍යයනය, නීතිය, කළමනාකරණය, පාලි, දර්ශනය, ශාරීරික අධ්‍යාපනය, දේශපාලන විද්‍යාව, මනෝවිද්‍යාව, සංස්කෘත, සිංහල, සමාජ විද්‍යාව සහ දෙමළ යන විෂයයන් ඇතුළත් වේ. තවද, ප්‍රජා සංවර්ධනය හා සැලසුම්කරණය, සංවර්ධන පිළිවෙත්, පාරිසරික කළමනාකරණය, මානව හිමිකම් සහ බහුසංස්කෘතිකවාදය, ජාත්‍යන්තර සබඳතා, සමාජ සේවය සහ තිරසාර සංචාරක ව්‍යාපාරය වැනි අන්තර්-විෂය/බහු-විෂය/වෘත්තීය ක්ෂේත්‍රවලපශ්චාත් උපාධි පාඨමාලා ද මෙම ආයතනය විසින් පිරිනමනු ලැබේ. ශ්‍රම බලකායේ විශේෂිත කුසලතා වර්ධනය කිරීම සඳහා කෙටිකාලීන පුහුණු වැඩසටහන් ද ආයතනය විසින් පවත්වනු ලබයි. මෙම අධ්‍යයන වැඩසටහන් ආයතනයේ අධ්‍යයන මණ්ඩල පහ මගින් මෙහෙයවනු ලබන අතර, සමස්ත කළමනාකරණය සහ මගපෙන්වීම කළමනාකරණ මණ්ඩලය මට්ටමින් සිදු කෙරේ.

2023 **වර්ෂයේ සිදුකරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් / ලද ජයග්‍රහණ**

2023 වසරේදී සියලුම පශ්චාත් උපාධි පාඨමාලා සඳහා බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව 512 කි. ඉහළ සුදුසුකම් ලත් සම්පත් දායකයින් 180 දෙනෙකු පමණ බාහිර ආචාර්යවරුන් සහ අධීක්ෂණ කාර්ය මණ්ඩලය ලෙස සම්බන්ධ වී සිටින අතර, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ශාස්ත්‍ර පීඨයේ ආචාර්යවරු වෙති. 2023 වසරේදී ශිෂ්‍ය ශිෂ්‍යාවෝ 233 දෙනෙක් ආයතනයේ පශ්චාත් උපාධි පාඨමාලා සම්පූර්ණ කළහ. වෘත්තීය සමිති ක්‍රියාමාර්ග සහ ආර්ථික අර්බුදයේ පවතින බලපෑම් මධ්‍යයේ වුවද, 2023 පෙබරවාරි මාසයේ බඳවා ගැනීම් සමඟ ආරම්භ වූ අධ්‍යයන වර්ෂය වසරක් තුළ සාර්ථකව නිම කිරීමට හැකිවීම පිළිබඳව අප විශේෂයෙන් සතුටු වෙමු. පන්ති කාමර සඳහා අවශ්‍ය උපකරණ සැපයීම සහ වසංගත සමයේ කථිකාචාර්යවරුන් ලැබූ මාර්ගගත ඉගැන්වීමේ අත්දැකීම්, මාර්ගගත සහ භෞතික ඉගැන්වීම් ක්‍රමවේදයන්ගේ එකතුවක් පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට ඉවහල් විය.

පර්යේෂණ ප්‍රතිඵල සම්බන්ධයෙන් ගත් කල, 2023 වසර තුළ දර්ශනපති (MPhil) සිසුන් 14 දෙනෙකු සහ දර්ශනසූරි (PhD) සිසුන් 7 දෙනෙකු විසින් සිය වැඩසටහන් සම්පූර්ණ කරන ලදී. 2023 දෙසැම්බර් මාසයේදී පුද්ගල සහභාගීත්වයෙන් භෞතිකව පවත්වන ලද පර්යේෂණ සමුළුව වසරේ විශේෂතම අවස්ථාව විය. ආයතනයේ පර්යේෂණ සිසුන්ට ඔවුන්ගේ ක්‍රියාත්මක වෙමින් පවතින හෝ නිම කරන ලද පර්යේෂණ ඉදිරිපත් කිරීමට මෙය අවස්ථාවක් වූ අතර, මෙහිදී ප්‍රධාන වශයෙන් ආයතනයේ පශ්චාත් උපාධි සිසුන් විසින් ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකා 72 ක් පිළිගෙන ඉදිරිපත් කරන ලදී.

2023 වසර තුළ, අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකයේ මෙහෙයුම් 2023 ආයතනික සමාලෝචනය සහ ඉදිරියේදී පැවැත්වීමට නියමිත පශ්චාත් උපාධි වැඩසටහන් සමාලෝචනය (2024-2028) සඳහා සූදානම් වීම කෙරෙහි යොමු විය. අදාළ ලේඛන ක්‍රමානුකූලව එකතු කිරීම සහ ගොනු කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මකව පවතින ක්‍රියාවලිය මෙයට ඇතුළත් වේ. අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකයේ සම්බන්ධීකාරකගේ

මගපෙන්වීම යටතේ අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකයේ ලේකම්වරයෙකුගෙන් සමන්විත ක්‍රියාකාරී IQAC ඒකකයක් මගින් මෙම කාර්යය පහසු කර ඇත.

2023 වසර තුළ, ආයතනය සිය සාමාන්‍ය පරිපාලන මෙහෙයුම් වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කරන ලදී. කොන්ත්‍රාත් පදනම මත අමතර කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, රැකියා ලැයිස්තු වල නිශ්චිතව දක්වා ඇති පරිපාලන හා මූල්‍ය වගකීම් බෙදා හැරීමට සහ පවරා ඇති රැකියා හා වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීම පිළිබඳව අධීක්ෂණය කිරීමට සහ පරීක්ෂා කිරීමට ආයතනයට උපකාරී වී ඇත.

2023 වර්ෂයේදී, ආයතනය විසින් විදේශීය විශ්වවිද්‍යාල/ආයතන සහ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය/පෞද්ගලික ආයතන වැනි දේශීය ආයතන සමඟ සිය සහයෝගීතාව අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. මේවාට (1) නෝර්වේ සවුත් ඊස්ටර්න් විශ්වවිද්‍යාලය සමඟ මානව හිමිකම් සහ බහුසංස්කෘතිකවාදය පිළිබඳ කාර්ය මණ්ඩල සහ ශිෂ්‍ය හුවමාරුව, (2) කෙටි කාලීන සහතික පත්‍ර පාඨමාලා පිරිනැමීම, ඉගැන්වීම් සඳහා උපකරණ මිලදී ගැනීම, ජාතික සමුළුවක් සම-සංවිධානය කිරීම සහ බෙල්ජියමේ Vrije විශ්වවිද්‍යාලය විසින් මෙහෙයවනු ලබන සහ තවත් විශ්වවිද්‍යාල හයක් සම්බන්ධ වන ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘතියක පුහුණු වැඩසටහන් සඳහා කාර්ය මණ්ඩල සහභාගීත්වය, (3) කැනඩා රජය සහ ශ්‍රී ලංකා රජය අතර ඒකාබද්ධ වැඩසටහනක් වන සහ රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වන NLEAP ව්‍යාපෘතිය යටතේ ජාතික භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ පර්යේෂණ ක්‍රියාකාරකම් සහ සොයාගැනීම් ප්‍රචලිත කිරීම, (4) යුනිසෙෆ් සංවිධානයසහ අධ්‍යාපන අමාත්‍යාංශය අතර ඒකාබද්ධ වැඩසටහනක් වන ප්‍රාථමික අධ්‍යාපනයේ බහු-මට්ටමේ ඉගැන්වීමේ (MLT) ප්‍රවේශය පිළිබඳව ධාරිතා ගොඩනැගීම සහ විෂයමාලා සංවර්ධනය යන කාර්යයන් ඇතුළත් වේ.

ආයතනික සැලැස්ම මත පදනම් වූ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම, සනාතන සභාව/පාලක සභාව විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති සම්මත කර ගැනීම සහ ආයතනයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා වූ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම දආයතනික සංවර්ධනයට ඇතුළත් විය.

**අභියෝග සහ අනාගත සැලසුම්**

- 2024 වසර සඳහා පුනරාවර්තන/ප්‍රාග්ධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් කිසිදු මුදලක් වෙන් නොකිරීම ආයතනයට මුහුණ දීමට සිදුවන ප්‍රධාන අභියෝගයක් වේ. මෙය පශ්චාත් උපාධි පාඨමාලා සඳහා අඩු ඉල්ලුමක් සහ පාඨමාලා පවත්වාගෙන යාමේ ඉහළ පිරිවැයක් පවතින වාතාවරණයක් තුළ සිදු වන්නකි. එබැවින් මෙම තත්ත්වය යටතේ පිරිවැය ඉක්මවූ අතිරික්ත ආදායමක් උපයා ගැනීම ආයතනයට අභියෝගාත්මක කාර්යයක් වනු ඇත.
- ආයතනයට දර්ශනපති/දර්ශනශූරී වැඩසටහන් සමාලෝචනය (2024 දී) සහ පාඨමාලා මත පදනම් වූ ශාස්ත්‍රපති වැඩසටහන් (2025-2028 දී) සකස් කර සම්පූර්ණ කළ යුතුව ඇත. ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩල හිඟය සැලකිල්ලට ගත් විට, මෙය සැලකිය යුතු කාලයක් ගන්නා සහ ප්‍රයත්නයක්දැරිය යුතු අභියෝගාත්මක කාර්යයක් වනු ඇත.
- වැඩි ජාත්‍යන්තරකරණයක් අපේක්ෂා කරමින්, අපි තෝරාගත් පශ්චාත් උපාධි පාඨමාලා විදේශීය වෙළෙඳපොළ අවශ්‍යතා හඳුනාගෙන ඒවා ඉලක්ක කර ගන්නෙමු. තවද, විෂයමාලා සංවර්ධනය, හුවමාරු අවස්ථා සහ පර්යේෂණ කටයුතු සඳහා විදේශීය විශ්වවිද්‍යාල සහ ආයතන සමඟ හවුල්කාරීත්ව අවස්ථා ගොඩනැගීම පිළිබඳව සොයා බලන්නෙමු. ශ්‍රී ලංකාවට අදාළ පර්යේෂණ සිදු කරන පශ්චාත් උපාධි සිසුන්ට සත්කාරකත්වය සැපයීම සඳහා විදේශීය විශ්වවිද්‍යාල/පීඨ කාර්ය මණ්ඩල සාමාජිකයන් සමඟ හවුල් වීමට අපි අවස්ථා සොයන්නෙමු.
- අවිනිශ්චිත ආර්ථිකවටපිටාව හේතුවෙන්, බාහිර අරමුදල් ලබා නොගෙනමහා පරිමාණ යටිතල පහසුකම් හෝ සංවර්ධන ව්‍යාපෘති සඳහා වියදම් දැරීමට ආයතනය මූල්‍යමය වශයෙන් ශක්තිමත් තත්ත්වයක නොමැත. ඒ අනුව, මෙම අවශ්‍යතා සපුරාලීම සඳහා ආයතනය විකල්ප යාන්ත්‍රණ පිළිබඳව සොයා බලනු ඇත.
- ආයතනයේ 2022 වර්ෂය සඳහා වූ මූල්‍ය ගිණුම් සඳහා විගණකාධිපති කාර්යාලයෙන් තත්ත්වාගණනය කළ මතයක් ලැබී ඇත. 2023 වර්ෂය තුළ, විගණන වාර්තාවේ මතු කර ඇති ගැටලු සඳහා ඍජුවම පිළියම් යෙදීම සඳහා ආයතනය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම ක්‍රියාවලිය හරහා 2023 සඳහා තත්ත්වාගණනය නොකළ විගණන මතයක් නැවත ලබා ගැනීමට හැකි වනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

අභියෝගාත්මක පරිසරයක් මධ්‍යයේ වුවද පසුගිය වසරේ ආයතනය සිය පරිපාලන හා මූල්‍ය කළමනාකරණය, වැඩසටහන් පැවැත්වීම, අධ්‍යයන හා පර්යේෂණ සංවර්ධනය, ධාරිතා සංවර්ධනය සහ සමස්ත ක්‍රියාකාරිත්වය සහ

කාර්ය සාධනය තුළ ස්ථාවර ප්‍රගතියක් ලබා ඇත. ආයතනයේ මෙහෙයුම් කටයුතු ආරම්භයේ සිට (2015 වර්ෂයේ) පළමු වසර 8 තුළ මේ දක්වා අත්කර ගෙන ඇති ප්‍රගතිය සහ එහි අනාගත සැලසුම්වල දක්වා ඇති මාවත, ඉදිරියේ ඇතිවිය හැකි අභියෝග මධ්‍යයේ වුවද, රටේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයන්හි විශිෂ්ටතා කේන්ද්‍රස්ථානය ලෙස ආයතනයේ ස්ථාවරත්වය තහවුරු කිරීමට උපකාරී වනු ඇතැයි මම අපේක්ෂා කරමි.

**මහාචාර්ය**
**එස්.ජේ.එස් ද මෙල්**
**අධ්‍යක්ෂ/මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

## 2 වන කොටස ආයතනයේ පසුබිම




**මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 24A වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සම්පාදනය කරන ලද ආඥා පනතක් මගින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිහිටුවන ලද ජාතික ආයතනයකි. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යාවන්හි අධ්‍යාපනය, පර්යේෂණ සහ නිර්මාණාත්මක චින්තනය පිළිබඳ විශිෂ්ටතා කේන්ද්‍රස්ථානයක් බවට පත්වීමත්, සමාජය කෙරෙහි සංවේදීතාවයකින් යුතු තාර්කික හා ස්වාධීන චින්තනය තුළින් දැනුම වර්ධනය කිරීමට කැපවූ විද්වතුන් බිහිකිරීමත් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි අරමුණයි.

2017 වර්ෂයේදී, ආයතනය සිය ප්‍රථම පස් අවුරුදු ආයතනික සැලැස්ම සකස් කරමින් ආයතනයේ කර්තව්‍යයන් ස්ථාපිත කරන ලදී. මෙම ආයතනික සැලැස්ම මගින් ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර තුනක් යටතේ අත්පත් කරගත යුතු ඉලක්ක 6ක් හඳුනාගෙන ඇත. එය පහත සඳහන් ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර තුන කෙරෙහි අවධානය යොමු කරයි: ඉගැන්වීමේ හා පර්යේෂණවල ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම; පරිපාලන හා මූල්‍ය කළමනාකරණයේ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම; සහ යහපාලනය හා ආචාරධර්මානුකූල හැසිරීම ශක්තිමත් කිරීම. 2018-2023 ආයතනික සැලැස්ම මගින් පහත සඳහන් ඉලක්ක හය යටතේ පරමාර්ථ දහඅටක් සහඋපායමාර්ග හතළිස් හතරක් යටතේ ක්‍රියාකාරකම් හැත්තෑ අටක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත:

- අධ්‍යයන වැඩසටහන්වල ප්‍රවේශ්‍යතාව, ගුණාත්මකභාවය සහ අදාළත්වය වැඩි දියුණු කිරීම.
- අන්‍යෝන්‍ය ගෞරවය, සමාජ සංවේදීතාව, ගුණාත්මක විද්වත්භාවය සහ වෘත්තීයභාවය මත පදනම් වූ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම.
- ක්‍රියාශීලී පර්යේෂණ සංස්කෘතියක් සහ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා කාර්යක්ෂම පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම.
- භෞතික යටිතල පහසුකම් සහ සේවා පහසුකම් සංවර්ධනය කිරීම.

- පරිපාලනයේ කාර්යක්ෂමතාව සහ මූල්‍ය කළමනාකරණයේ තිරසාරත්වය ළඟා කර ගැනීම, සහ
- ආයතනයේ සියලු කටයුතුවලදී විනිවිදභාවය සහ යහපාලනය සහතික කිරීම.

ආයතනික සැලැස්මේ ක්‍රියාමාර්ග සාර්ථකව ක්‍රියාත්මක කිරීම තුළින්, මෙම ආයතනය රටේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යාවන් පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යාපනය, පර්යේෂණ සහ තාර්කික චින්තනයේ ප්‍රමුඛයා බවට මෙන්ම කලාපයේ ඉගෙනුම් විශිෂ්ටතා මධ්‍යස්ථානයක් බවට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වර්තමානයේ ආයතනය පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන්ට අදාළ උපාධි වැඩසටහන් පවත්වයි:

- පශ්චාත් උපාධි ඩිප්ලෝමාව;
- ශාස්ත්‍රපති;
- දර්ශනපති; සහ දර්ශන ශූරී

ඉහත සුදුසුකම් සඳහා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයමගින් පුහුණුව ලබා දෙන විෂය ක්ෂේත්‍රවලට: අරාබි, ගිණුම්කරණය සහ මූල්‍ය, පුරාවිද්‍යාව, බෞද්ධ අධ්‍යයනය, ආර්ථික විද්‍යාව, අධ්‍යාපනය, ඉංග්‍රීසි, ලලිත කලා, භූගෝල විද්‍යාව, ග්‍රීක සහ රෝම අධ්‍යයනය, හින්දු ශිෂ්ටාචාරය, ඉතිහාසය, ඉස්ලාමීය ශිෂ්ටාචාරය, කළමනාකරණය, පාලි, දර්ශනය, ශාරීරික අධ්‍යාපනය, දේශපාලන විද්‍යාව, මනෝවිද්‍යාව, සංස්කෘත, සිංහල, සමාජ විද්‍යාව සහ දෙමළ යන විෂයයන් ඇතුළත් වේ.

2023 වන විට ආයතනය විසින් පහත දැක්වෙන තේමාත්මක පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් පිරිනමනු ලබයි:

- ව්‍යවහාරික ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති වැඩසටහන;
- අධ්‍යාපනපති වැඩසටහන;
- සංවර්ධන පිළිවෙත් පිළිබඳ ශාස්ත්‍රපති වැඩසටහන;
- තිරසාර සංචාරක ව්‍යාපාරය පිළිබඳ විද්‍යාපති;
- තිරසාර සංචාරක ව්‍යාපාරය පිළිබඳ ශාස්ත්‍රපති වැඩසටහන;
- ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති වැඩසටහන;
- මානව හිමිකම් සහ බහු සංස්කෘතිකවාදය පිළිබඳ ශාස්ත්‍රපති;
- සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති වැඩසටහන;
- පාරිසරික කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති වැඩසටහන.

2022 වර්ෂයේ අග භාගයේදී, බැංකුකරණය පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන පිරිනැමීම සඳහා ආයතනය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදී. මෙම වැඩසටහන ලබන වසරේ ආරම්භ කිරීමට ආයතනය සැලසුම් කරයි. 2023 වර්ෂය ආරම්භයේදී, අප ආයතනය විසින් උපයන ආදායම වැඩි කර ගැනීම සඳහා ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන ලදී.

දැනට පවතින වැඩසටහන් සඳහා ප්‍රවේශය පුළුල් කිරීමෙන් සහ අන්තර් විෂය සහ බහුවිධවිෂය පිළිබඳ අවධානය යොමු කරමින් නව වැඩසටහන් හඳුන්වා දීමෙන් සිය පශ්චාත් උපාධි වැඩසටහන් පුළුල් කිරීමට සහ විවිධාංගීකරණය කිරීමට ආයතනය සිය සැලසුම් අඛණ්ඩව ක්‍රියාත්මක කරයි. ආයතනික සැලැස්මේ හඳුනාගෙන ඇති පරිදි සහ අවශ්‍යතාවය පැන නගින පරිදි නව උපාධි වැඩසටහන් සංවර්ධනය කිරීම ආයතනය විසින් අඛණ්ඩව සිදු කරනු ලැබේ. තවද, පෞද්ගලික සහ රාජ්‍ය ආයතන සමඟ සහයෝගයෙන් යුතුව ශ්‍රම බලකාය සඳහා නව කෙටිකාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම ද සිදුකරනු ඇත

| 3 වන කොටස | ශිෂ්‍ය බඳවාගැනීම් |
|---|---|

අංක1සිට 5 දක්වා වන වගු මගින් 2023 දෙසැම්බර් 31 වන දිනට ආයතනයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වී ඇති ශිෂ්‍ය සංඛ්‍යාව දක්වයි. 2023 වර්ෂය තුළදී, ආයතනය සිය පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලා සඳහා සිසුන් 542 දෙනෙකු ඇතුළත් කරගෙන ඇත. 2022 වර්ෂයට සාපේක්ෂව, 2023 දී ආයතනයේ ශිෂ්‍ය බඳවා ගැනීම් 71% කින් අඩු වී ඇත.

1 වන වගුව
වැඩසටහන අනුව ශිෂ්‍ය බඳවාගැනීම, 2021 - 2023 (දෙසැම්බර් 31 වනවිට)

| වැඩසටහන | 2021 | 2022 | 2023 |
|---|---|---|---|
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් | 147 | 768 | 46 |
| ශාස්ත්‍රපති / අධ්‍යාපන ශාස්ත්‍රපති/ පිළිවෙත් පිළිබඳ ශාස්ත්‍රපති වැඩසටහන් | 381 | 95 | 385 |
| දර්ශනපති | 146 | 06 | 101 |
| දර්ශන ශූරී | 31 | 05 | 10 |
| **එකතුව** | **705** | **874** | **542** |

මූලාශ්‍රය: ලේඛකාධිකාරී කාර්යාලය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

**සටහන:** * අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (සති අන්ත) සහ අධ්‍යාපන ශාස්ත්‍රපති පාඨමාලා පිරිනමනු නොලැබුණි.

2022 වර්ෂයට සාපේක්ෂව, 2023 වර්ෂයේදී ද අධ්‍යාපනය ඇතුළු සියලුම විෂය ක්ෂේත්‍රවල ශාස්ත්‍රපති කලා පාඨමාලා සඳහා වැඩිම ශිෂ්‍ය සංඛ්‍යාවක් ලියාපදිංචි වී ඇති බව පෙන්නුම් කරයි. 2022 වර්ෂය හා සසඳන විට, 2023 වර්ෂය සඳහා දර්ශනපති (MPhil) සහ දර්ශන ශූරී (PhD) උපාධි පාඨමාලා සඳහා ඇතුළත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි වී ඇත.

රූප සටහන 1
2022 සහ 2023 වසරවල වැඩසටහන අනුව ශිෂ්‍යබඳවාගැනීමේප්‍ර තිශතව්‍යාප්තිය




මූලාශ්‍රය: 1 වන වගුවමත පදනම්ව

රූප සටහන 1 මගින් අධ්‍යයන පාඨමාලා අනුව ශිෂ්‍ය බඳවා ගැනීමේ ප්‍රතිශත ව්‍යාප්තිය දක්වයි. 2022 සහ 2023 යන වසර දෙක අතර වැඩසටහන් අනුව ශිෂ්‍ය බඳවා ගැනීමේ ප්‍රතිශත ව්‍යාප්තිය සැලකිය යුතු වෙනසක් පෙන්නුම් කරයි.

2 වන වගුව මගින් 2021, 2022 සහ 2023 යන අධ්‍යයන වර්ෂ සඳහා පාඨමාලා සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව ශිෂ්‍ය බඳවා ගැනීම් දක්වයි. 2023 දී මුළු බඳවා ගැනීම්වලින් 38% ක් පමණ පිරිමි සහ 62% ක් කාන්තාවන් විය. 2023 වර්ෂයේ වැඩසටහන් අනුව ශිෂ්‍ය බඳවා ගැනීමේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව ව්‍යාප්තිය 2 වන වගුවේ දක්වා ඇත.

2 වන වගුව
අධ්‍යයන වර්ෂ සඳහා පාඨමාලා සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව ශිෂ්‍ය බඳවා ගැනීම්, 2021 – 2023 (දෙසැම්බර්31වනවිට)

| වැඩසටහන | 2021 | | 2022 | | 2023 | |
|---|---|---|---|---|---|---|
| | පි | කා | පි | කා | පි | කා |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් | 85 | 344 | 135 | 633 | 10 | 36 |
| ශාස්ත්‍රපති / අධ්‍යාපන ශාස්ත්‍රපති / සංවර්ධන පිළිවෙත් පිළිබඳ ශාස්ත්‍රපති වැඩසටහන් | 83 | 128 | 32 | 63 | 138 | 247 |
| දර්ශනපති | 16 | 3 | 1 | 5 | 49 | 52 |
| දර්ශන ශූරී | 1 | 1 | 4 | 1 | 7 | 3 |
| එකතුව | **185** | **476** | **172** | **702** | **204** | **338** |

මූලාශ්‍රය: ලේඛකාධිකාරී කාර්යාලය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

රූප සටහන 2
පාඨමාලා සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව ශිෂ්‍ය බඳවා ගැනීම, 2022 – 2023




මූලාශ්‍රය: 2 වන වගුව මත පදනම්ව

වගුව 2 සහ රූප සටහන 2 මගින් 2021 සිට 2023 දක්වා අධ්‍යයන වර්ෂ සඳහා පාඨමාලා සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව ශිෂ්‍ය බඳවා ගැනීම් දක්වයි. 2022 අධ්‍යයන වර්ෂයේදී, මුළු බඳවා ගැනීම්වලින් 19% ක් පමණ පිරිමි සහ 81% ක් කාන්තාවන් විය. මෙම අනුපාත 2023 අධ්‍යයන වර්ෂයේදී පිළිවෙලින් 38% සහ 62% දක්වා වෙනස් වී ඇත. 2023 දී සියලුම පාඨමාලා සඳහා ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේම සමස්ත ලියාපදිංචි වීමේ ප්‍රතිශතක අඩුවීමක් දක්නට ලැබෙන අතර විශේෂයෙන් පශ්චාත් උපාධි ඩිප්ලෝමා ශිෂ්‍ය ලියාපදිංචිය ඉතා ඉහළ ප්‍රතිශතයකින් අඩු වී

ඇත. මෙම කාලය තුළ රටේ ආර්ථික තත්ත්වය දැඩි අර්බුදකාරී තත්ත්වයක පැවතීම ශිෂ්‍ය ලියාපදිංචිය අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබේ.

**සමාජ විද්‍යා අධ්‍යයන මණ්ඩලය විසින් පහත සඳහන් පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලා පිරිනමනු ලබයි**

ව්‍යවහාරික භූගෝලීය තොරතුරු පද්ධති පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
භූගෝල විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
ඉතිහාසය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
දේශපාලන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (ඉවත්වීමේ විකල්පය)
මානව හිමිකම් සහ බහු සංස්කෘතිකවාදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (ඉවත්වීමේ විකල්පය)
ප්‍රජා සංවර්ධනය සහ සැලසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

පුරාවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
මානව හිමිකම් සහ බහු සංස්කෘතිකවාදය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය

ඉහත විෂයයන් හෝ අන්තර් විෂය ක්ෂේත්‍රයන්හි දර්ශනපති සහ දර්ශන ශූරී උපාධි පාඨමාලා.

**භාෂා සහ සාහිත්‍ය අධ්‍යයන අධ්‍යයන මණ්ඩලය විසින් පහත සඳහන් පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලා පිරිනු ලබයි:**

සිංහල භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
දෙමළ භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

සිංහල භාෂාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
දෙමළ භාෂාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය

ඉහත විෂයයන් හෝ අන්තර් විෂය ක්ෂේත්‍රයන්හි දර්ශනපති සහ දර්ශන ශූරී උපාධි පාඨමාලා.

**ආර්ථික විද්‍යා හා කළමනාකරණ අධ්‍යයන මණ්ඩලය විසින් පහත සඳහන් පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලා පිරිනු ලබයි:**

ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
ගිණුම්කරණය සහ මූල්‍ය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
සංවර්ධන පිළිවෙත් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (ඉවත්වීමේ විකල්පය)
ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
ව්‍යවහාරික ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
සංවර්ධන පිළිවෙත් පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
තිරසාර සංචාරක ව්‍යාපාරය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
තිරසාර සංචාරක ව්‍යාපාරය පිළිබඳ විද්‍යාපති උපාධිය
සමාජ සේවා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය

ඉහත විෂයයන් හෝ අන්තර් විෂය ක්ෂේත්‍රයන්හි දර්ශනපති සහ දර්ශන ශූරී උපාධි පාඨමාලා.

**මනෝවිද්‍යාව, දර්ශනය සහ අධ්‍යාපන අධ්‍යයන මණ්ඩලය විසින් දැනට පහත සඳහන් පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලා පිරිනු ලබයි:**

මනෝවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
දර්ශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
දර්ශනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය.
ඉහත විෂයයන් හෝ අන්තර් විෂය ක්ෂේත්‍රයන්හි දර්ශනපති සහ දර්ශන ශූරී උපාධි පාඨමාලා.

ශිෂ්‍ය බඳවා ගැනීම් අනුව අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ අධ්‍යාපන ශාස්ත්‍රපති පාඨමාලා විශාලතම වැඩසටහන් ලෙස පවතී. අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම ක්‍රම දෙකකින් සිදුකෙරේ එනම්, සතියේ දින වැඩසටහන සහ සති අන්ත වැඩසටහන වශයෙන්. සතියේ දින වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තෝරාගත් සිසුන් සඳහා පිරිනමනු ලැබේ. එබැවින්, ඒ සඳහා බඳවා ගැනීමේ කාලය ආයතනයට පාලනය කළ නොහැක.

**ආගමික හා සංස්කෘතික අධ්‍යයන සඳහා වන අධ්‍යයන මණ්ඩලය විසින් දැනට පහත සඳහන් වැඩසටහන් ඉදිරිපත් කරනු ලබයි:**

බෞද්ධ අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
පාලි පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
සංස්කෘත පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
ග්‍රීක සහ රෝම අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
හින්දු ශිෂ්ටාචාරය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
ඉස්ලාමීය ශිෂ්ටාචාරය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
ලලිත කලා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
පාලි පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
සංස්කෘත පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
ග්‍රීක සහ රෝම අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
හින්දු ශිෂ්ටාචාරය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
ඉස්ලාමීය ශිෂ්ටාචාරය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
ලලිත කලා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය.

ඉහත විෂයයන් හෝ අන්තර් විෂය ක්ෂේත්‍රයන්හි දර්ශනපති සහ දර්ශන ශූරී උපාධි පාඨමාලා.

3 වන වගුව මගින් අධ්‍යයන මණ්ඩලය විසින් පිරිනමනු ලබන පශ්චාත් උපාධි පාඨමාලා සහ 2022 සහ 2023 ශිෂ්‍ය බඳවා ගැනීම් දක්වයි.

**3 වන වගුව**

අධ්‍යයන මණ්ඩල මගින් පිරිනමනු ලබන පාඨමාලා ඒකක සහ ශිෂ්‍ය බඳවා ගැනීම් 2022 සහ 2023(දෙසැම්බර් 31 දිනට)

| අධ්‍යයන මණ්ඩලය | **2022** | **2023** |
|---|---|---|
| සමාජ විද්‍යා | 07 | 271 |
| භාෂා සහ සාහිත්‍ය අධ්‍යයන | 01 | 72 |
| ආර්ථික විද්‍යාව සහ කළමනාකරණය | 02 | 102 |
| මනෝ විද්‍යාව, දර්ශනය සහ අධ්‍යාපනය | 863 | 38 |
| ආගමික හා සංස්කෘතික අධ්‍යයනයන් | 09 | 59 |

| එකතුව | **882** | **542** |
|---|---|---|

මූලාශ්‍රය: ලේඛකාධිකාරී කාර්යාලය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

## 4 වන කොටස විදේශ ශිෂ්‍ය බඳවාගැනීම්



ආයතනයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ උපාධි වැඩසටහන් සඳහා ලියාපදිංචි වී ඇති විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාව 4 වන වගුවේ දැක්වෙයි.විදේශීය ශිෂ්‍යයෝ බහුතරයක් පාලි සහ බෞද්ධ අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල සහ පර්යේෂණවල නිරත වෙති. 2023 වර්ෂයේදී, ආයතනය විසින් සිය උපාධි වැඩසටහන් සඳහා විදේශීය ශිෂ්‍යයන් 28 දෙනෙකු ඇතුළත් කර ගන්නා ලදී. 2022 වර්ෂය හා සැසඳීමේදී මෙම සංඛ්‍යාව ඉහළ ගොස් ඇත. මෙම ශිෂ්‍යයින් 28 දෙනා ශාස්ත්‍රපති උපාධිය සඳහා 19ක්, දර්ශනපති උපාධි වැඩසටහන් සඳහා 07ක් සහ දර්ශන ශූරී උපාධිය සඳහා ශිෂ්‍යයින් 02ක් ලෙස වැඩසටහන් අතර බෙදී ගියහ.

4 වන වගුව

වැඩසටහන අනුව විදේශීය ශිෂ්‍ය බඳවාගැනීම්, 2021 -2023 (දෙසැම්බර් 31 වනවිට)

| වැඩසටහන | **2021** | **2022** | **2023** |
|---|---|---|---|
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 0 | 0 | 0 |
| ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් | 9 | 02 | 19 |
| දර්ශනපති උපාධි | 3 | 02 | 07 |
| දර්ශන ශූරී උපාධි | 0 | 04 | 02 |
| එකතුව | **12** | **08** | **28** |

මූලාශ්‍රය: ලේඛකාධිකාරී කාර්යාලය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

## 5 වන කොටස | වැඩසටහන් සම්පූර්ණ කිරීම

5 වන වගුවේ 2021 සිට 2023 දක්වා වසරවල උපාධි වැඩසටහන් සම්පූර්ණ කිරීම පිළිබඳ විස්තර සපයයි. පශ්චාත් උපාධි ඩිප්ලෝමා ශිෂ්‍යයින් හැර, අනෙකුත් සියලුම පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍යයින්, 2023 අධ්‍යයන වර්ෂයේදී තම උපාධිය සාර්ථකව නිම කිරීමේ ප්‍රතිශතක වර්ධනයක් පෙන්නුම් කරයි. 2023 වසරේදී සිය අධ්‍යයන කටයුතු සාර්ථකව නිම කළ ශිෂ්‍යයින්ගෙන් 834 දෙනෙකු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවද, ශිෂ්‍යයින් 402 දෙනෙකු ශාස්ත්‍රපති උපාධි වැඩසටහනද, ශිෂ්‍යයින් 21 දෙනෙකු දර්ශනපති උපාධි වැඩසටහනද, ශිෂ්‍යයින් 09 දෙනෙකු දර්ශන ශූරී උපාධි වැඩසටහනද සම්පූර්ණ කර ඇත

5 වන වගුව
2021 – 2023 වැඩසටහන සම්පූර්ණ කළ සිසුන් සංඛ්‍යාව
(දෙසැම්බර් 31 දිනවනවිට)

| වැඩසටහන | 2021 | | 2022 | | 2023 | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් | 429 | 64.90 | 100 | 25.64 | 834 | 65.88 |
| ශාස්ත්‍රපති / අධ්‍යාපන ශාස්ත්‍රපති / සංවර්ධන පිළිවෙත් පිළිබඳ ශාස්ත්‍රපති වැඩසටහන් | 211 | 31.92 | 256 | 65.64 | 402 | 31.75 |
| දර්ශනපති | 19 | 2.87 | 24 | 6.15 | 21 | 1.66 |
| දර්ශන ශූරී | 6 | 0.30 | 10 | 2.56 | 09 | 0.71 |
| එකතුව | **665** | **100.00** | **390** | **100.00** | **1266** | **100** |

මූලාශ්‍රය: ලේඛකාධිකාරී කාර්යාලය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

පසුගිය කාලයේ විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේදී ඇති වූ දීර්ඝ ප්‍රමාදයන්, වැඩසටහන් නිම කිරීමේ කාලයට සහ එමඟින් ශිෂ්‍යයන්ගේ වෘත්තීය ප්‍රගතියට අහිතකර ලෙස බලපායි. 2018 වසරේ සිට, පරීක්ෂකවරුන්ට පැහැදිලි මාර්ගෝපදේශ සහ උපදෙස් ලබා දීම මගින් ප්‍රතිඵල නිකුත් කිරීමට ගතවන කාලය අඩු කිරීමට පියවර ගෙන ඇත. කෙසේ වෙතත්, ප්‍රතිඵල නිකුත් කිරීමේදී තවදුරටත් සිදුවන ප්‍රමාදයන් අවම කර ගැනීම සඳහා අධීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කළ යුතුය.

## 6 වන කොටස | අධ්‍යයන කාර්යමණ්ඩලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2023 වර්ෂයේදී සිය උපාධි වැඩසටහන් පැවැත්වීම සඳහා බාහිර පදනම මත අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 169 දෙනෙකුගේ සේවය ලබාගෙන ඇත. 6 වන වගුවේ දක්වා ඇති පරිදි, මහාචාර්යවරුන් 50ක්, සහාය මහාචාර්යවරුන් 73ක්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් (I සහ II ශ්‍රේණි) 00ක්, සහ පශ්චාත් උපාධි සුදුසුකම් සහිත කථිකාචාර්යවරුන් 56ක් ඊට ඇතුළත් වේ. මෙම බාහිර අධ්‍යයන කාර්ය මණ්ඩලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයෙන් සහ අනෙකුත් පීඨවලින්, ශ්‍රී ලංකාවේ අනෙකුත් විශ්වවිද්‍යාලවලින්, ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි පර්යේෂණ සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවලින් සහ විශ්‍රාමික විද්වතුන්ගෙන් ලබාගෙන ඇත. 3 වන රූප සටහන මගින් අධ්‍යයන කාර්ය මණ්ඩල වර්ගීකරණය අනුව බාහිර කාර්ය මණ්ඩලයේ ප්‍රතිශතක ව්‍යාප්තිය දක්වයි. ඉගැන්වීම් සහ නිබන්ධන අධීක්ෂණය සඳහා සම්බන්ධ වූ

මහාචාර්යවරුන්ගේ සංඛ්‍යාව, මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් 29.6%ක් පමණ විය.තවද, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශ්‍රේණියේ අධ්‍යයන කාර්ය මණ්ඩලය මුළු බාහිර කාර්ය මණ්ඩලයෙන් 0%ක් විය.ඉතිරි කොටස, විශේෂයෙන් දර්ශනපති හෝ ඊට ඉහළ පශ්චාත් උපාධි සුදුසුකම් සහිත කථිකාචාර්ය ශ්‍රේණියේ අය වෙති.මුළු බාහිර කාර්ය මණ්ඩලයෙන් 78%ක් පුරුෂයින් වන අතර 21%ක් කාන්තාවන්ය.

6වන වගුව

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේබාහිර අධ්‍යයන කාර්ය මණ්ඩලය (2023 දෙසැම්බර් 31 වන දිනට)

| විෂය | මහාචාර්යවරු | | සහාය මහාචාර්යවරු | | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු | | කථිකාචාර්යවරු | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පි | කා | පි | කා | පි | කා | පි | කා | පි | කා |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයේ පශ්චාත් උපාධි වැඩසටහන් ඉගැන්වීම, අධීක්ෂණය සඳහා සම්බන්ධ වන කාර්ය මණ්ඩලය. | 45 | 5 | 59 | 14 | 00 | 00 | 28 | 18 | 132 | 37 |

මූලාශ්‍රය: ලේඛකාධිකාරී කාර්යාලය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

3 වනරූපසටහන

භාහිරකාර්යමණ්ඩලයේප්‍රතිශතකව්‍යාප්තිය - 2023




මූලාශ්‍රය: 6 වන වගුව මත පදනම්ව

## 7 වන කොටස සේවක වර්ගීකරණය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයසතුව අධ්‍යක්ෂවරයෙකු, සහකාර ලේඛකාධිකාරීවරයෙකු, සහකාර මූල්‍යාධිකාරීවරයෙකු, ලඝුලේඛකයෙකු, ශ්‍රව්‍ය-දෘශ්‍ය තාක්ෂණික නිලධාරියෙකු, තාක්ෂණික නිලධාරියෙකු, කළමනාකරණ සහකාරවරුන් 05 දෙනෙකු, මුදල් අයකැමියෙකු, රියදුරෙකු සහ කම්කරුවෙකු ඇතුළුව අනුමත තනතුරු 13ක් ඇත.සියලුම අනුමත තනතුරු 2019 වන විට පුරවා තිබුණි.ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත, ආයතනයේ මනා ක්‍රියාකාරිත්වය සඳහා අමතර සේවක සංඛ්‍යා අවශ්‍යතා 15ක් කළමනාකරණ මණ්ඩලය විසින් හඳුනාගෙන මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා යොමු කර ඇත.

7 වන වගුව
සේවකවර්ගීකරණය (2023 දෙසැම්බර්31 දිනට)

| සේවාකාණ්ඩය | වැටුප් කේතය | ස්ථිර | | එකතුව |
|---|---|---|---|---|
| | | පිරිමි | කාන්තා | |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | | | | |
| මහාචාර්ය / ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | U-AC 5 | 1 | 0 | 1 |
| තෘතියික මට්ටම | | | | |
| කනිෂ්ඨ විධායක නිලධාරීන්/ කළමනාකරුවන් | U-EX 1 | 2 | 0 | 2 |
| ද්විතීයික මට්ටම | | | | |
| සහකාර නිලධාරීන් - 1 කොටස | U-MN 3 | 0 | 0 | 0 |
| කළමනාකරණ සහකාර - තාක්ෂණික | U-MT 1 | 2 | 0 | 2 |
| කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන | U-MN 1 | 1 | 5 | 6 |
| ප්‍රාථමික මට්ටම | | | | |
| ප්‍රාථමික ශ්‍රේණිය - පුහුණු | PL-3 | 1 | 0 | 1 |
| ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු | PL-1 | 3 | 0 | 1 |
| | | | | |
| කොන්ත්‍රාත් පදනම මත ලිපිකරු සහ අනුබද්ධ කාර්ය මණ්ඩලය | | | | 17 |
| කොන්ත්‍රාත් පදනම මත ප්‍රාථමික කාර්ය මණ්ඩලය | | | | 3 |
| | | **එකතුව** | | **33** |

මූලාශ්‍රය: ලේඛකාධිකාරී කාර්යාලය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

ප්‍රමාණවත් ස්ථිර තනතුරු සංඛ්‍යාවක් නොමැති වීම නිසා, ආයතනය විසින් උපයන ලද අරමුදල්වලින් කොන්ත්‍රාත් පදනම මත කාර්ය මණ්ඩල සාමාජිකයින් 20 දෙනෙකුගේ සේවය ලබාගෙන ඇති අතර, එය ස්ථිර තනතුරුවල රාජකාරි සහ වගකීම් ආවරණය කිරීමට මෙන්ම අමතර වැඩ බර අඩු කිරීමට ඉවහල් වී ඇත.මෙම තනතුරුවලට ලිපිකරු සහ ඒ ආශ්‍රිත කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 17ක් සහ ප්‍රාථමික කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 3ක් ඇතුළත් වේ.

| 8 වන කොටස | පර්යේෂණ ප්‍රකාශන සහ ඉදිරිපත්කිරීම් |
|---|---|

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයන්හි පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ දැනුම ව්‍යාප්ත කිරීම මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ එක් වැදගත් ඉලක්කයකි.වර්තමානයේ එය ප්‍රධාන වශයෙන් ආචාර්ය උපාධි වැඩසටහන, දර්ශනපති වැඩසටහන සහ පාඨමාලා සහ පර්යේෂණ සහිත ශාස්ත්‍රපති වැඩසටහන්වල ශිෂ්‍යයන්ගේ පර්යේෂණ ව්‍යාපෘති හරහා පර්යේෂණ කටයුතුවල නිරත වේ. 2023 වර්ෂයේදී ආයතනයේ ශිෂ්‍යයන් සහ පර්යේෂකයන් විසින් සිදු කරන ලද පර්යේෂණ ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම් සංඛ්‍යාවපහත 8 වගුවේ දැක්වෙයි. 2023 දී, පර්යේෂණ ශිෂ්‍යයින් 41 දෙනෙකු සිය නිබන්ධන සම්පූර්ණ කර ආයතනයට ඉදිරිපත් කර ඇති අතර, එයින් නිබන්ධන 11 ක් ආචාර්ය උපාධි නිබන්ධන සහ නිබන්ධන 27 ක් දර්ශනපතිඋපාධි නිබන්ධන විය. 9 වන වගුවේ 2023 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද නිබන්ධන පිළිබඳ විස්තර දැක්වේ.

8 වන වගුව

පර්යේෂණ ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම්, 2023

| විෂය | සම්පූර්ණ කරන ලද/ පළ කරන ලද | ඉදිරිපත් කරන ලද |
|---|---|---|
| නිබන්ධන | 41 | 41 |
| ලිපි | 65 | 65 |
| වෙනත් | --- | --- |
| එකතුව | 106 | 106 |

මූලාශ්‍රය: ලේඛකාධිකාරී කාර්යාලය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

9 වන වගුව

2023 දී සම්පූර්ණ කරන ලද නිබන්ධන පිළිබඳ විස්තර

| අනු අංකය | ශිෂ්‍යයාගේ නම | නිබන්ධනයේ මාතෘකාව | උපාධිය | අධ්‍යයන මණ්ඩලය |
|---|---|---|---|---|
| 1 | පූජ්‍ය එච්.සද්ධාතිස්සහිමි | කැප්පෙටිපොළ අධිකාරවම්සො: චම්පු කාව්‍ය සංරචනාව සහ පදගතාර්ථ පරිවර්තනය ඇතුළත් අධ්‍යයනයක් | දර්ශන ශූරී | ආගමික හා සංස්කෘතික අධ්‍යයන |
| 2 | එච්.එම්.ආර්.කේ.එන්. ප්‍රියන්ති | විසි එක්වන සියවසේ විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරුවිද්‍යාවසහගණිතයඅධ්‍යාපනය සඳහා කණිෂ්ඨ ද්විතීයික විද්‍යා ගුරුවරුන් සවිබල ගැන්වීම | දර්ශන ශූරී | මනෝ විද්‍යාව, දර්ශනය සහ අධ්‍යාපනය |
| 3 | එස්.එම්.එල්.කේ සෙනෙවිරත්න | ශ්‍රී ලංකාවේ පාසල් ඇගයීමේ වත්මන් ක්‍රමවේද: පාසල් ඇගයීම් ක්‍රියාවලිය තවදුරටත් සංවර්ධනය සඳහා පාඩම් | දර්ශන ශූරී | මනෝ විද්‍යාව, දර්ශනය සහ අධ්‍යාපනය |
| 4 | ගරු එස්.ඩී. පරිමලව්වෙල්වන් පියතුමා | ශ්‍රී ලංකාව සඳහා සන්දර්භීය විමුක්ති ආචාර ධර්ම: ලතින් ඇමරිකානු විමුක්ති ආචාර ධර්ම සහ ක්‍රිස්තියානි බටහිර ආචාර ධර්මවල පුද්ගලවාදී ප්‍රවේශයන් පිළිබඳ විවේචනාත්මක විශ්ලේෂණයක් | දර්ශන ශූරී | මනෝ විද්‍යාව, දර්ශනය සහ අධ්‍යාපනය |

| | | | | |
|---|---|---|---|---|
| 5 | ඩබ්ලිව්.එම්.එස්.බී. වන්නිනායක | අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් සඳහා ගංවතුර අවදානම් කළමනාකරණය: ශ්‍රී ලංකාවේ දැදුරු ඔය ද්‍රෝණියේ පහළ කොටස ආශ්‍රිත සිද්ධි අධ්‍යයනය | දර්ශන ශූරී | සමාජ විද්‍යාවන් |
| 6 | පූජ්‍ය ඩී.උපනන්දහිමි | ඇමරිකා එක්සත් ජනපදයේ මනෝචිකිත්සාවක් ලෙස බෞද්ධ විදර්ශනා භාවනාවේ සංවර්ධනය පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් | දර්ශන ශූරී | ආගමික හා සංස්කෘතික අධ්‍යයන |
| 7 | පූජ්‍ය අග්ගනානි හිමි | සුත්තන්ත හා අභිධම්ම පිටකය පදනම් කරගත් විතක්ක (මුල් සිතුවිලි) පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් | දර්ශන ශූරී | ආගමික හා සංස්කෘතික අධ්‍යයන |
| 8 | එම්.ජී.ජේ.ආර් රාජපක්ෂ | කවිරාජ ධෝයිගේ පවනදූත සංස්කෘත කාව්‍යය: සවිස්තරාත්මක සිංහල පරිවර්තනයක් සහිත විචාරයක් | දර්ශන ශූරී | ආගමික හා සංස්කෘතික අධ්‍යයන |
| 9 | ඊ.එම්.ඩබ්.ඩබ්.එන්.එ ස්.බී. ඒකනායක | ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති කෙරෙහි ක්ෂුද්‍ර මූල්‍ය උපාය මාර්ගයේ බලපෑම: සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන පිළිබඳ අධ්‍යයනයක් | දර්ශන ශූරී | සමාජ විද්‍යාවන් |
| 10 | එන්.වාමන් | ශෛව සිද්ධාන්තයේ සංවර්ධනය සඳහා ශ්‍රී ලාංකේය දායකත්වය පිළිබඳ පුළුල් අධ්‍යයනයක්: 20 වන සියවසේ ග්‍රන්ථ සහ පිළිවෙත් පදනම් කරගෙන | දර්ශන ශූරී | ආගමික හා සංස්කෘතික අධ්‍යයන |
| 11 | ටී.ජීවරාජා | ඉතිහාස ග්‍රන්ථ සහ ආස්වාර් ගීතිකා: සංසන්දනාත්මක අධ්‍යයනයක් | දර්ශන ශූරී | භාෂාසහ සාහිත්‍යය අධ්‍යයන |
| 12 | ජ්.එම්.එස්.පී අබේකෝන් | යොවුන් වියේ දරුවන්ගේ දෙමාපියකරණය: දෙමාපියකරණ ශෛලීන් පිළිබඳ ගවේෂණාත්මක අධ්‍යයනයක් | දර්ශන පති | මනෝ විද්‍යාව, දර්ශනය සහ අධ්‍යාපනය |
| 13 | එල්.අයි ඒකනායක | ශ්‍රී ලංකාවේ වැඩිහිටි විශාදයේ රෝග ලක්ෂණ හා සම්බන්ධ සාධක පිළිබඳ ගුණාත්මක අධ්‍යයනයක් | දර්ශන පති | මනෝවිද්‍යාව, දර්ශනය සහ අධ්‍යාපනය |
| 14 | යූ.වී.එන් දුරගේ | පෙර පාසල් දරුවන් තුළ ළමා ලිංගික අපයෝජනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක සඵලතාවය පිළිබඳ අධ්‍යයනයක් | දර්ශන පති | මනෝ විද්‍යාව, දර්ශනය සහ අධ්‍යාපනය |
| 15 | පූජ්‍ය ජී. නන්ද හිමි | ගෝලීය පාරිසරික අර්බුද අවම කිරීම සඳහා බෞද්ධ පාරිසරික ආචාර ධර්ම උපයෝගී කර ගැනීම: බුදුදහම පදනම් කරගත් දාර්ශනික අධ්‍යයනයක් | දර්ශන පති | මනෝ විද්‍යාව, දර්ශනය සහ අධ්‍යාපනය |

| | | | | |
|---|---|---|---|---|
| 16 | ඒ.කේ.ඒ.එස් ඥානරත්න | ශ්‍රී ලංකාවේ පශ්චාත්-යුද සංවර්ධනය සහ ප්‍රතිසංස්කරණය සඳහා විශ්‍රාමික සොල්දාදුවන්ගේ විභව භූමිකාව පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් | දර්ශන පති | සමාජ විද්‍යාවන් |
| 17 | එම්.ඒ.කේ.එච් මුණසිංහ | "බුද්ධ පාද (බුදුන් වහන්සේගේ ශ්‍රී පතුල)" සංකල්පයේ ඓතිහාසික සම්භවය සහ විකාශනය පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් | දර්ශන පති | ආගමික හා සංස්කෘතික අධ්‍යයන |
| 18 | පූජ්‍ය. එච්. සිරිසුමන හිමි | සූත්‍ර පිටකයේ නිරූපිත පාර-සංජානන ඉගැන්වීම් උපාය මාර්ග පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් | දර්ශන පති | මනෝ විද්‍යාව, දර්ශනය සහ අධ්‍යාපනය |
| 19 | එච්.වී.එස් ආරියසිංහ | තෝරාගත් පාලි මූලාශ්‍රවල එන මනෝචිකිත්සක ඉගැන්වීම් පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් | දර්ශන පති | මනෝ විද්‍යාව, දර්ශනය සහඅධ්‍යාපනය |
| 20 | ඩී. හේමාලෝක හිමි | ථෙරවාද බුදුදහමේ නිරූපිත ගුරු ආචාර ධර්ම පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් | දර්ශන පති | මනෝ විද්‍යාව, දර්ශනය සහ අධ්‍යාපනය |
| 21 | ර්.එම්.යූ.ඩබ්.එච්.ඩී.කේ. අබේරත්න | එක්සත් ජනපදය සහ චීනය අතර තාක්ෂණික යුද්ධය: කුඩා රාජ්‍යයක ප්‍රතිචාරය පිළිබඳ අධ්‍යයනයක් | දර්ශන පති | සමාජ විද්‍යාවන් |
| 22 | වී. ලිඳකුඹුර | අ.පො.ස. (උ/පෙළ) විෂය නිර්දේශයේ සාමාන්‍ය තොරතුරු තාක්ෂණය (GIT) පාසල් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට බලපාන ස්වභාවය සහ සාධක පිළිබඳ අධ්‍යයනයක් | දර්ශන පති | මනෝ විද්‍යාව, දර්ශනය සහ අධ්‍යාපනය |
| 23 | බී.බී.එන්. දේවප්‍රිය | දේශපාලනය-මානව ස්වභාවය: මාක්ස්ගේ 1844 ආර්ථික හා දාර්ශනික අත්පිටපත් පිළිබඳ දාර්ශනික විමර්ශනයක් | දර්ශන පති | මනෝ විද්‍යාව, දර්ශනය සහ අධ්‍යාපනය |
| 24 | එස්.එම්.පී.ජේ බණ්ඩාර | ශ්‍රී ලංකාවේ බලය බෙදීමේ විධිවිධානය සහ මධ්‍යම රජය හා පළාත් සභා අතර මතභේදාත්මක ගැටලු: උතුරු මැද පළාත් සභාව ආශ්‍රිත සිද්ධි අධ්‍යයනයක් | දර්ශන පති | සමාජ විද්‍යාවන් |
| 25 | ජී.යූ.එස්. කුරුගල | උඩරට සම්ප්‍රදායේ බෞද්ධ විහාරාරාම චිත්‍ර සන්දර්භයන්හි නිරූපිත ප්‍රභූන් සහ භික්ෂූන් සම්බන්ධයෙන් වන සමාජ-දේශපාලන කතිකාව පිළිබඳ පුරාවිද්‍යාත්මක විශ්ලේෂණයක් | දර්ශන පති | සමාජ විද්‍යාවන් |
| 26 | පූජ්‍යපී සුමනතිස්ස හිමි | මානසික රෝග සහ ඒවාට හේතු පිළිබඳ බෞද්ධ මනෝවිද්‍යාවේ දෘෂ්ටිකෝණයෙන් විස්තරාත්මක අධ්‍යයනයක් | දර්ශන පති | ආගමික හා සංස්කෘතික අධ්‍යයන |

| | | | | |
|---|---|---|---|---|
| 27 | එන්.එම්.පී.ඒ. නාරායන | කාය රූපය සහ සමාජ මාධ්‍ය: ශ්‍රී ලාංකික යොවුන් වියේ දරුවන්ගේ ජීවන අත්දැකීම් පිළිබඳ විශ්ලේෂණයක් | දර්ශන පති | මනෝ විද්‍යාව, දර්ශනය සහ අධ්‍යාපනය |
| 28 | පූජ්‍ය ඒ. විමලජෝති හිමි | පාලි ටීකා (අනුටීකා) වල නිරූපිත විවරණ ක්‍රමවේදය: විමර්ශනාත්මක අධ්‍යයනයක් | දර්ශන පති | ආගමික හා සංස්කෘතික අධ්‍යයන |
| 29 | කේ.එම්. තරංග | විසිවන සියවසේ ශ්‍රී ලාංකේය මුද්‍රණ කලාව සහ එහි ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනයක් | දර්ශන පති | ආගමික හා සංස්කෘතික අධ්‍යයන |
| 30 | වී. කමලසිරි | විමධ්‍යගතකරණය, පළාත් පාලනය සහ ප්‍රාදේශීය ස්වයං පාලනය: නැගෙනහිර ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සභා ආශ්‍රිත සිද්ධි අධ්‍යයනයක් | දර්ශන පති | සමාජ විද්‍යාවන් |
| 31 | එම්.බී.එස් සාක්කි | ශ්‍රී ලංකාවේ පශ්චාත්-යුද විදේශ ප්‍රතිපත්තිය: ශ්‍රී ලංකාව සහ චීනය අතර ද්විපාර්ශ්වික සබඳතාවල අවස්ථා සහ අභියෝග පිළිබඳ අධ්‍යයනයක්(2009-2019) | දර්ශන පති | සමාජ විද්‍යාවන් |
| 32 | එන්. ලියනගේ | ශ්‍රී ලාංකේය ප්‍රාක්-දේශප්‍රේමී නූතන කලා සම්ප්‍රදායන් පිළිබඳ අධ්‍යයනයක් (තෝරාගත් ශ්‍රී ලාංකික කලාකරුවන් ඇසුරින්) | දර්ශන පති | ආගමික හා සංස්කෘතික අධ්‍යයන |
| 33 | ඩී.එම්.ආර්. දැල්පිටිය | ශ්‍රී ලාංකේය ස්ථාපන කලාවේ සමාජ-දේශපාලන සන්දර්භය පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් | දර්ශන පති | ආගමික හා සංස්කෘතික අධ්‍යයන |
| 34 | ඒ.එස්. විජේකෝන් | පුරාණ ශ්‍රී ලාංකේය දෘශ්‍ය කලාවේ නිරූපිත නර්තන ක්‍රම පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් (ක්‍රි.ව. 05 වන සියවසේ සිට 12 වන සියවස දක්වා සිතුවම්, මූර්ති සහ කැටයම් විශේෂයෙන් ඇසුරින්) | දර්ශන පති | ආගමික හා සංස්කෘතික අධ්‍යයන |
| 35 | ඒ.පී. සිරිසේන | කුලය සහ උඩරට නැටුම්: තෝරාගත් උඩරට නර්තන පරම්පරා පිළිබඳ අධ්‍යයනයක් | දර්ශන පති | ආගමික හා සංස්කෘතික අධ්‍යයන |
| 36 | ඒ.එච්. වනසිංහ | කණිෂ්ඨ ද්විතීයික සිසුන්ට විද්‍යාව ඉගැන්වීමේදී 21 වන සියවසේ කුසලතා වර්ධනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික උපාංග සහ යෙදුම් ඉගැන්වීම් ආධාරක ලෙස භාවිතා කිරීම පිළිබඳ අධ්‍යයනයක් | දර්ශන පති | මනෝ විද්‍යාව, දර්ශනය සහ අධ්‍යාපනය |
| 37 | ටී. ගෝර්ඩන් | නූතන ඉන්දීය අධ්‍යාපන පද්ධතියේ සංවර්ධනය ඇසුරින් රබීන්ද්‍රනාත් තාගෝර් සහ රාධක්‍රිෂ්ණන්ගේ අධ්‍යාපන දර්ශනයන් පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක් | දර්ශන පති | මනෝවිද්‍යාව, දර්ශනය සහ අධ්‍යාපනය |

| | | | | |
|---|---|---|---|---|
| 38 | ගරු ඒ.එන් එදිරිවික්‍රම පියතුමා | ජීවය තහවුරු කිරීමක් ලෙස පැවැත්ම සඳහා වූ අභිලාශය: ඇන්ටි-ක්‍රයිස්ට් හි නීට්ෂියානු ක්‍රිස්තියානි දෘෂ්ටිය හෙළිදරව් කිරීම | දර්ශන පති | මනෝවිද්‍යාව, දර්ශනය සහ අධ්‍යාපනය |
| 39 | පූජ්‍ය ශි හොංග්ෂෙන් හිමි | හාංෂාන් මහාචාර්යවරයාගේ "අවතංසක සූත්‍ර සාරාංශය" ලෙස හැඳින්වෙන *හුවායන්ජිං ගාංයාවෝ්ව* හි වටවල් පහ පිළිබඳ අධ්‍යයනයක් | ශාස්ත්‍රපති | ආගමික හා සංස්කෘතික අධ්‍යයන |
| 40 | පූජ්‍ය හැංග් ෂියැංෆෙන් හිමි | මූල මධ්‍යමක කාරිකාවේ අටුවාවන්හි සඳහන් 'ත්‍රී-ඉස්' ගාථාව පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් | ශාස්ත්‍රපති | ආගමික හා සංස්කෘතික අධ්‍යයන |
| 41 | පූජ්‍ය. සුබිලැන්ග් | "බුදුන් වහන්සේ සිහි කිරීමේ රත්නරාජ සමාධිය පිළිබඳ ඍජු මාර්ගෝපදේශය" තුළින් පිළිබිඹු වන බුද්ධානුස්සති සමාධිය පිළිබඳ අධ්‍යයනයක් | ශාස්ත්‍රපති | ආගමික හා සංස්කෘතික අධ්‍යයන |

**මූලාශ්‍රය: ලේඛකාධිකාරී කාර්යාලය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

පැවැති වසංගත තත්ත්වයෙන් අනතුරුව ශ්‍රී ලාංකීය උසස් අධ්‍යාපනයේ තීරණාත්මක මොහොතක් සනිටුහන් කරමින් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 පර්යේෂණ සමුළුව පැවැත්විණි. අධ්‍යාපන ක්‍රමය මාර්ගගත (virtual) ක්‍රමයේ සිට භෞතික (in-person) ක්‍රමය දක්වා පරිවර්තනය වීමත් සමඟ, පශ්චාත් උපාධි ආයතනය මෙවර පර්යේෂණ සමුළුව භෞතිකව සංවිධානය කිරීමට තරයේ කටයුතු කළ අතර, එමගින් පශ්චාත් උපාධි අපේක්ෂකයින්ට ඔවුන්ගේ පර්යේෂණ අත්දැකීම් බෙදාහදා ගැනීමට පුළුල් අවකාශයක් විවෘත විය. සම්මන්ත්‍රණ පැවැත්වීමෙන් සහ පර්යේෂණ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමට පහසුකම් සැලසීමෙන්, නිර්මාණය වන දැනුම ව්‍යාප්ත කිරීමට සහ බෙදා ගැනීමට මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මූලිකත්වය ගෙන කටයුතු කළේය. 2023 වසරේදී, මෙම ආයතනය විසින් සිය 6 වන වාර්ෂික පර්යේෂණ සැසිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය එම්.ඩී. ලමාවංශ මැතිතුමාගේ ගෞරවනීය සහභාගීත්වයෙන් දෙසැම්බර් 15 වන දින ආයතන ශ්‍රවණාගාරයේදී සාර්ථකව පවත්වන ලදී. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 පර්යේෂණ සමුළුව සඳහා සාරාංශ ඉදිරිපත් කිරීම් 92ක් ලැබී තිබුණි. ඉහත 92න්, සාරාංශ 65ක් සමුළුවේදී වාචික ඉදිරිපත් කිරීම් සඳහා තෝරා ගන්නා ලද අතර, ඒවා සමුළු වාර්තාවේ පළ කරන ලදී.




ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම් තුළින් ඵලදායී හා උසස් තත්ත්වයේ පර්යේෂණ පැතිකඩක් පවත්වා ගනිමින්, සිය පශ්චාත් උපාධි අපේක්ෂකයින් විසින් සිදු කරනු ලබන පර්යේෂණ දිරිමත් කිරීමට සහ ඒවාට සහාය වීමට වැඩි වශයෙන් සම්පත් සහ පහසුකම් සැපයීමට ආයතනය අදහස් කරයි. දේශීය සහ/හෝ විදේශීය පුද්ගලයින්, කණ්ඩායම් සහ පිළිගත් සංවිධාන සමඟ උසස් අධ්‍යාපන හා පර්යේෂණ වැඩසටහන්වල ඵලදායී සබඳතා ඇති කර

ගැනීම තුළින් පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ආයතනයේ වත්මන් දායකත්වය තවදුරටත් පුළුල් කිරීමට ප්‍රයත්න දරනු ලැබේ. උපාධි වැඩසටහන්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ නියෝජිතායතන, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය සහ අනෙකුත් උසස් අධ්‍යාපනික හා පුහුණු ආයතන වැනි දේශීය ආයතන සමඟ සබඳතා සහ සහයෝගීතාවයන් ස්ථාපිත කරනු ඇත.

| 9 වන කොටස | පුහුණුසැසි සහ වැඩමුළු |
|---|---|

**පර්යේෂණ ශිෂ්‍යයන් සඳහා පැවැත්වූ වැඩමුළුව**

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පර්යේෂණ සහිත ශාස්ත්‍රපති, දර්ශනපති සහ දර්ශන ශූරී පාඨමාලා හදාරන සිය පර්යේෂණ ශිෂ්‍යයන් සඳහා වැඩමුළුවක් පවත්වන ලදී. ශිෂ්‍යයන්ගේ ශාස්ත්‍රීය ලේඛන කුසලතා වැඩි දියුණු කිරීමමෙම වැඩමුළුවේ අරමුණ විය.

පළමු වැඩමුළුව 2023 අප්‍රේල් 5 වන දින "සමාජ විද්‍යා පර්යේෂණවල පර්යේෂණ ගැටලු: සංකල්පගත කිරීම සහ ගොඩනැගීම" යන තේමාව යටතේ පවත්වන ලදී. ශාස්ත්‍ර පීඨයේ, භූගෝල විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය, එච්.ඒ.එන්.එම්. හෙන්නායක මහතා මෙම වැඩමුළුවේ ආරාධිත කථිකයා විය.මෙම වැඩමුළුව ශිෂ්‍යයන් 45 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

වැඩමුළුවේ දෙවන දිනය 2023 අප්‍රේල් 7 වන දින "මානව ශාස්ත්‍රීය ශේෂ්ත්‍රයේ ශාස්ත්‍රීය ලේඛනයේදී නිවැරදිතාව" යන තේමාව යටතේ පැවැත්විණි. මෙම වැඩමුළුවේ ආරාධිත කථිකයා වූයේ ශාස්ත්‍ර පීඨයේ, සම්භාව්‍ය භාෂා අධ්‍යයනාංශයේ සංස්කෘත භාෂාව පිළිබඳ මහාචාර්ය, රෝහණ සෙනෙවිරත්න මහතාය. ශිෂ්‍යයෝ 55 දෙනෙක් මෙම වැඩමුළුව සඳහා ක්‍රියාකාරීව සහභාගී වූහ.

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේකාර්ය මණ්ඩලය සඳහා පැවැත්වූ පුහුණු සැසි**

ආයතනය සිය පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව, දැනුම සහ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී. ඒ අනුව, කාර්යාල කළමනාකරණය පිළිබඳ වැඩමුළුව 2023 මැයි 09 සහ 10 යන දිනවල මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මණ්ඩලික රැස්වීම් කාමරයේදී පැවැත්විණි.

| 10 වන කොටස | උපාධි ප්‍රදානෝත්සවය සහ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය |
|---|---|



මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ උපාධිධාරී ශිෂ්‍යයන්ගේ උපාධි සහතික පත්‍ර 2023 මැයි 25 වන දින පැවති විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රධානෝත්සවයේ දී උත්සවාකාරයෙන් ප්‍රදානය කරන ලදී. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශාස්ත්‍රපති, සංවර්ධන පිළිවෙත් පිළිබඳ ශාස්ත්‍රපති, අධ්‍යාපනපති, දර්ශනපති සහ දර්ශන ශූරී උපාධි වැඩසටහන්වල ශිෂ්‍යයන් හාරසිය තිස් දෙදෙනෙක් (432) 2023 වසරේදී උපාධි ලැබූහ.

ආයතනයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන සම්පූර්ණ කළ ශිෂ්‍යයන් සඳහා ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයක් විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2023 ජූලි 29 වන දින පවත්වන ලදී. මෙම අවස්ථාවේදී ශිෂ්‍යයන් අටසිය තිස් හතර දෙනෙක් (834) පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකපත්‍ර ලබා ගත්හ.

## 11වන කොටස විදේශීය/දේශීය සහයෝගීතා

**ජාතික භාෂා සමානාත්මතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (NLEAP)**

කැනඩා රජයේ අරමුදල් මත ඇලීනියා ඉන්ටර්නැෂනල් ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික භාෂා සමානාත්මතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, භාෂා අයිතිවාසිකම් උපයෝගී කරගනිමින් අන්තර්ග්‍රහණය පුළුල් කිරීම තුළින් සංහිඳියාව, ජාතික සමගිය සහ සාමය හා ආරක්ෂාව පෝෂණය කිරීම සඳහා වන ශ්‍රී ලංකාවේ අපේක්ෂාවන්ට සහාය වීම සඳහා කැනඩාවේ කැපවීම පිළිබිඹු කරයි. එමෙන්ම, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම තුළින් ව්‍යවස්ථාපිත භාෂාමය අයිතිවාසිකම් ක්‍රමානුකූලව සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය දරන කැපවීම ඵලදායී ලෙස ප්‍රදර්ශනය කිරීමට ද එය මග සලසයි.

"බහු සංස්කෘතික සමාජයක ව්‍යවස්ථාපිත භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම: ශ්‍රී ලංකාවේ භාෂා ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට බලපාන දේශපාලන, සංස්කෘතික සහ ආයතනික සාධක පිළිබඳ අධ්‍යයනයක්" යන මාතෘකාව යටතේ පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කිරීම සඳහා ජාතික භාෂා සමානාත්මතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය විසින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට ප්‍රදානයක් පිරිනමා ඇත.

මෙම වසරක ව්‍යාපෘතිය 2022 වසරේ අවසන් මාස කිහිපය වන විට සියයට 80ක් දක්වා සම්පූර්ණ කර තිබූ අතර 2023 වන විට එය සම්පූර්ණයෙන්ම නිම කර ඇත.



මෙම ව්‍යාපෘතිය සඳහා දත්ත රැස්කිරීම මධ්‍යම, දකුණ, උතුර සහ බස්නාහිර පළාත් පදනම් කරගෙන සිදු කරන ලද අතර, මෙහිදී විශේෂයෙන්ම මහජනතාවට රාජ්‍ය සේවා සපයන රාජ්‍ය පරිපාලකයින් සහ ග්‍රාමීය ප්‍රජාවන්, ප්‍රාදේශීය සුළුතර ප්‍රජාවන්, යුද්ධයෙන් පීඩාවට පත් වූවන්, කාන්තාවන්, තරුණයින්, විවිධ රාජ්‍ය සේවාවන් අපේක්ෂා කරන විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් කෙරෙහි අවධානය යොමු කරන ලදී.

**අග්නිදිග නෝර්වේ විශ්වවිද්‍යාලය සහ NORPART ව්‍යාපෘතිය**

2018 වසරේදී, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, අග්නිදිග නෝර්වේ විශ්වවිද්‍යාලය සමඟ එක්ව මානව හිමිකම් සහ බහුසංස්කෘතිකවාදය පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යාපනය, පර්යේෂණ සහ ශාස්ත්‍රීය සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා NORPART ව්‍යාපෘති ප්‍රදානය යටතේ ආරම්භ කරන ලද කාර්ය මණ්ඩල සහ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. 2019 වසරේදී, පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ අග්නිදිග නෝර්වේ විශ්වවිද්‍යාලයඅතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමත් සමඟ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයසහ අග්නිදිග නෝර්වේ විශ්වවිද්‍යාලය NORPART ව්‍යාපෘතිය යටතේ ශිෂ්‍යකාර්ය මණ්ඩල හුවමාරුව සහ ශාස්ත්‍රීය සහයෝගීතාව අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

WP2 වැඩසටහන යටතේ ශිෂ්‍ය සංචලතාව සැලසුම් කළ පරිදි සිදු කර ඇත. 2023 වසන්ත අධ්‍යයන වාරයේදී, කාර්ය මණ්ඩල සාමාජිකයින් 4 දෙනෙකු 7.5 ECTS (කුසලතා අංක 15) සම්පූර්ණ කරමින් අග්නිදිග නෝර්වේ විශ්වවිද්‍යාලයේ එක්අධ්‍යයන වාරයක අධ්‍යයන කටයුතු සාර්ථකව නිම කරන ලද අතර, සිසුන් 03 දෙනෙකු 15 ECTS (කුසලතා අංක 30) සම්පූර්ණ කරමින් අග්නිදිග නෝර්වේ විශ්වවිද්‍යාලයේ සරත් අධ්‍යයන වාරය නිම කරන ලදී. ඒකාබද්ධ පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති යටතේ, අග්නිදිග නෝර්වේ විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 4 දෙනෙකු 2019 පෙබරවාරි මාසයේදී මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයවෙත පැමිණියහ.

**ඉන්දියානු සාගර කලාපයේ ආපදා අවදානම් අවම කිරීම සහ කළමනාකරණය සඳහා වූ විශ්වවිද්‍යාල ජාලව්‍යාපෘතිය**

බ්‍රසල්ස් හි ව්‍රිජේ විශ්වවිද්‍යාලය (ප්‍රධාන අයදුම්කරු), පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ තවත් හවුල්කාර විශ්වවිද්‍යාල/ආයතන 7ක් සමඟ එක්ව 2019 වසරේදී යුරෝපා කොමිසම විසින් අරමුදල් සපයන ආපදා කළමනාකරණය පිළිබඳ Erasmus + ධාරිතා ගොඩනැගීමේ ව්‍යාපෘතියක් සඳහා ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. මෙම ව්‍යාපෘතිය පුහුණු වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ විශ්වවිද්‍යාල ජාලයක් ලෙස පර්යේෂණ පැවැත්වීම තුළින් ඉන්දියානු සාගර කලාපයේ ආපදා අවදානම් අවම කිරීම සහ කළමනාකරණය පිළිබඳ ධාරිතා ගොඩනැගීම සඳහා පහසුකම් සැලසීමට සකස් කර ඇත. අයදුම්පත් 800කට අධික සංඛ්‍යාවක් අතුරින්, බ්‍රසල්ස් හි ව්‍රිජේ විශ්වවිද්‍යාලයසහ හවුල්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත අරමුදල් සැපයීම සඳහා තෝරාගෙන ඇත. මෙම ව්‍යාපෘතිය 2023 වසරේදී සාර්ථකව ආරම්භ කරන ලදී.

**බහු මට්ටමේ ඉගැන්වීම්**

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයයුනිසෙෆ්ආයතනයේ සහාය ඇතිව අධ්‍යාපනයට අදාළ වැඩසටහන්වල විෂයමාලාවට බහු මට්ටමේ ඉගැන්වීම් (MLT) හඳුන්වා දීමේ ව්‍යාපෘතියක් පවත්වන ලදී. මෙයට බහු මට්ටමේ ඉගැන්වීම් දැනටමත් නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වන ඌව සහ නැගෙනහිර පළාත්වල සිදුකළ පන්තිකාමර වෙත ක්ෂේත්‍ර චාරිකා සහ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා, පාර්ශවකරුවන් සමඟ විෂයමාලා සංවර්ධන වැඩමුළු, විෂයමාලා සංවර්ධන ක්‍රියාකාරකම් සහ බහු මට්ටමේ ඉගැන්වීම්ප්‍රවේශයන් අනුගමනය කිරීම පිළිබඳ කථිකාචාර්යවරුන් පුහුණු කිරීම යනාදී කටයුතු ඇතුළත් විය.

## SEDRIC

මුල් ව්‍යාපෘතිය ක්ෂේත්‍ර චාරිකා සම්බන්ධයෙන් ඇතිවූ සීමාවන් හේතුවෙන් අඩු කරන ලද අතර, එය ශ්‍රී ලංකාව තුළ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය පිළිබඳ අධ්‍යයනයක් ඇතුළත් කිරීමට පුළුල් කරන ලද අතර එය ඉදිරියේදී ග්‍රන්ථයක් වශයෙන් ප්‍රකාශයට පත් කෙරෙනු ඇත. පරිච්ඡේද කිහිපයක් අවසන් කර ඇති අතර මේ වන විට ඒවා දේශීය භාෂාවලට පරිවර්තනය වෙමින් පවතී.

## 12 වන කොටස | තිරසර සංවර්ධනය මතපදනම්ව සාක්ෂාත්කරගැනීමට අපේක්ෂිත ඉලක්ක පිළිබඳ වාර්තාව

ආයතනයේ සියලුම අධ්‍යයන හා පර්යේෂණ වැඩසටහන් සහ පාඨමාලා, 2018 අංක 19 දරන විගණන පනතේ III වන කොටසේ 17(ඇ) උපවගන්තියේ විස්තර කර ඇති පරමාර්ථයන්ට අනුකූලව ක්‍රියාත්මක වේ.

| | | | | | | | | | ඔව් / නැත | නව තැන්පතු අංකය /ගිණුම් අංකය | කාලය | පොලී අනුපාතය (වාර්ෂිකව) | ඊළඟ පරිණත වීමේ දිනය | | | | |
| | | | | | | (රු.) | (රු.) | (රු.) | | | | | | | (රු.) | (රු.) | (රු.) |
| 1 | 11.09.2017 | මහජන බැංකුව | 057600100023749-6 | 21.00% | වර්ෂ 1 යි | 3,263,086.20 | 685,248.10 | 685,248.10 | ඔව් | 057600100023749-6 | වර්ෂ 1 යි | 21.00% | 15.05.2024 | - | - | - | 3,948,334.30 |
| 2 | 01.06.2018 | මහජන බැංකුව | 057600100021682-9 | 21.00% | වර්ෂ 1 යි | 3,419,725.91 | 718,142.44 | 718,142.44 | ඔව් | 057600100021682-9 | වර්ෂ 1 යි | 21.00% | 31.05.2024 | - | - | - | 4,137,868.35 |
| 3 | 01.06.2018 | මහජන බැංකුව | 057600100021685-6 | 21.00% | වර්ෂ 1 යි | 1,423,490.70 | 298,933.04 | 298,933.04 | ඔව් | 057600100021685-6 | වර්ෂ 1 යි | 21.00% | 31.05.2024 | - | - | - | 1,722,423.74 |
| 4 | 01.06.2018 | මහජන බැංකුව | 057600100021683-8 | 5.50% | වර්ෂ 1 යි | 1,423,490.70 | 298,933.04 | 298,933.04 | ඔව් | 057600100021683-8 | වර්ෂ 1 යි | 21.00% | 31.05.2024 | - | - | - | 1,722,423.74 |
| 5 | 09.07.2018 | ලංකා බැංකුව | 82889149 | 24.00% | වර්ෂ 1 යි | 6,173,388.05 | 1,407,532.47 | 1,407,532.47 | ඔව් | 82889149 | වර්ෂ 1 යි | 12.00% | 11.07.2024 | - | - | - | 7,580,920.52 |
| 6 | 09.07.2018 | ලංකා බැංකුව | 82889315 | 24.00% | වර්ෂ 1 යි | 6,173,388.05 | 1,407,532.47 | 1,407,532.47 | ඔව් | 82889315 | වර්ෂ 1 යි | 24.00% | 11.07.2024 | - | - | - | 7,580,920.52 |
| 7 | 31.07.2019 | ජා.ඉ. බැංකුව | 2-0148-01-26691 | 25.00% | වර්ෂ 1 යි | 18,493,252.28 | 4,392,147.35 | 4,392,147.35 | ඔව් | 2-0148-01-26691 | වර්ෂ 1 යි | 13.00% | 31.07.2024 | - | - | - | 22,885,399.63 |
| 8 | 16.08.2019 | ලංකා බැංකුව | 84732182 | 26.00% | වර්ෂ 1 යි | 3,000,268.01 | | 741,066.20 | ඔව් | 84732182 | වර්ෂ 1 යි | 26.00% | 17.08.2023 | 18.08.2023 | 3,000,268.01 | 741,066.20 | - |
| 9 | 29.11.2019 | මහජන බැංකුව | 057600100024786-8 | 28.00% | වර්ෂ 1 යි | 12,611,243.07 | 3,531,148.06 | 3,531,148.05 | ඔව් | 057600100024786-8 | වර්ෂ 1 යි | 12.00% | 28.11.2024 | - | - | - | 16,142,391.13 |
| 10 | 12.12.2019 | ලංකා බැංකුව | 85247855 | 26.00% | වර්ෂ 1 යි | 18,952,805.60 | 4,681,342.98 | 4,681,342.98 | ඔව් | 85247855 | වර්ෂ 1 යි | 26.00% | 14.12.2023 | | | | 23,634,148.58 |
| 11 | 18.12.2018 | ජා.ඉ. බැංකුව | 2-0127-01-86040 | 26.00% | වර්ෂ 1 යි | 8,518,172.18 | 2,103,988.48 | 2,103,988.48 | ඔව් | 2-0127-02-08230 | වර්ෂ 1 යි | 11.25% | 18.12.2024 | - | - | - | 10,622,160.66 |
| 12 | 30.12.2019 | ලංකා බැංකුව | 85319032 | 8.50% | වර්ෂ 1 යි | 8,856,366.15 | - | - | ඔව් | 85319032 | වර්ෂ 1 යි | 26.00% | 01.01.2024 | - | - | - | 8,856,366.15 |
| 13 | 30.09.2020 | මහජන බැංකුව | 057600100022290-1 | 30.50% | වර්ෂ 1 යි | 11,262,375.00 | - | 3,435,024.37 | ඔව් | 057600100022290-1 | වර්ෂ 1 යි | 30.50% | 29.09.2023 | 02.10.2023 | 11,262,375.00 | 3,435,024.37 | - |
| 14 | 26.11.2020 | මහජන බැංකුව | 057600100031065-5 | 28.00% | වර්ෂ 1 යි | 5,723,375.00 | - | 1,602,545.00 | ඔව් | 057600100031065-5 | වර්ෂ 1 යි | 28.00% | 25.11.2023 | 27.11.2023 | 5,723,375.00 | 1,602,545.00 | - |
| 15 | 15.10.2021 | ජා.ඉ. බැංකුව | 057600100030141-5 | 30.60% | වර්ෂ 1 යි | 10,791,000.00 | 3,302,046.00 | 3,302,046.00 | ඔව් | 057600100030141-5 | වර්ෂ 1 යි | 12.00% | 17.10.2024 | - | - | - | 14,093,046.00 |
| 16 | 29.12.2021 | මහජන බැංකුව | 057600100025003-2 | 26.00% | වර්ෂ 1 යි | 10,850,000.00 | 2,821,000.00 | 2,821,000.00 | ඔව් | 057600100025003-2 | වර්ෂ 1 යි | 12.00% | 29.12.2024 | - | - | - | 13,671,000.00 |
| 17 | 30.06.2022 | මහජන බැංකුව | 057600100028002-7 | 22.25% | වර්ෂ 1 යි | 15,000,000.00 | 3,337,500.00 | 3,337,500.00 | ඔව් | 057600100028002-7 | වර්ෂ 1 යි | 16.00% | 31.05.2024 | | | | 18,337,500.00 |
| 18 | 21.11.2022 | ලංකා බැංකුව | 89899631 | 31.10% | වර්ෂ 1 යි | 10,000,000.00 | 2,954,500.00 | 2,954,500.00 | ඔව් | 89899631 | වර්ෂ 1 යි | 12.50% | 21.11.2024 | | | | 12,954,500.00 |
| 19 | 21.11.2022 | ලංකා බැංකුව | 89899628 | 31.10% | වර්ෂ 1 යි | 10,000,000.00 | 2,954,500.00 | 2,954,500.00 | ඔව් | 89899628 | වර්ෂ 1 යි | 12.50% | 21.11.2024 | | | | 12,954,500.00 |
| 20 | 21.11.2022 | ලංකා බැංකුව | 89899622 | 31.10% | වර්ෂ 1 යි | 10,000,000.00 | 2,954,500.00 | 2,954,500.00 | ඔව් | 89899622 | වර්ෂ 1 යි | 12.50% | 21.11.2024 | | | | 12,954,500.00 |
| 21 | 16.12.2022 | ජා.ඉ. බැංකුව | 2-0148-01-32276 | 26.00% | වර්ෂ 1 යි | 40,000,000.00 | 9,880,000.00 | 9,880,000.00 | ඔව් | 2-018-01-39190 | වර්ෂ 1 යි | 11.25% | 16.12.2024 | | | | 49,880,000.00 |
| 22 | 16.12.2022 | ජා.ඉ. බැංකුව | 2-0148-01-32268 | 26.00% | වර්ෂ 1 යි | 6,000,000.00 | 1,482,000.00 | 1,482,000.00 | ඔව් | 2-0148-01-39181 | වර්ෂ 1 යි | 11.25% | 16.12.2024 | | | | 7,482,000.00 |
| 23 | 17.12.2022 | මහජන බැංකුව | 057600100030857-9 | 26.00% | මාස 1 යි | 5,102,739.73 | - | 112,679.68 | ඔව් | 057600100030857-9 | 26.00% | මාස 1 යි | 17.12.2023 | 18.01.2023 | 5,102,739.73 | 112,679.68 | - |
| 24 | 28.02.2023 | මහජන බැංකුව | 057600100032703-1 | 12.75% | මාස 1 යි | - | 11,961,233.12 | 1,090,758.53 | නැත | 057600100032703-1 | 12.75% | මාස 1 යි | 27.08.2023 | 27.08.2023 | 11,961,233.12 | 129,525.41 | - |
| 25 | 28.02.2023 | මහජන බැංකුව | 057600100032701-3 | 24.00% | මාස 1 යි | - | 4,073,643.84 | 73,643.84 | නැත | 057600100032701-3 | 23.00% | මාස 1 යි | 27.04.2023 | 27.04.2023 | 4,073,643.84 | - | - |
| 26 | 28.02.2023 | මහජන බැංකුව | 057600100032702-2 | 24.00% | මාස 1 යි | - | 5,092,054.79 | 191,524.24 | නැත | 057600100032702-2 | 23.00% | මාස 1 යි | 27.04.2023 | 28.04.2023 | 5,092,054.79 | 99,469.45 | - |
| එකතුව | | | | | | **227,038,166.63** | **70,337,926.18** | **56,458,236.28** | | | | | | | **46,215,689.49** | **6,120,310.11** | **251,160,403.32** |

උපලේඛනය ඉ

විලම්භිත ආදායම

| අංකය | වැඩසටහන | 2023 විලම්භිත ආදායම<br>රු. | 2023 විලම්භිත ආදායම<br>2024 ට අදාළ<br>රු. | 2025 ට අදාළ<br>රු. |
|---|---|---|---|---|
| 1 | දර්ශන ශූරී වැඩසටහන | 333,485.25 | 333,485.25 | - |
| 2 | දර්ශන පති වැඩසටහන | 1,443,304.83 | 1,443,304.83 | - |
| 3 | ශාස්ත්‍රපති වැඩසටහන | 3,686,055.34 | 3,686,055.34 | - |
| 4 | පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන | 1,184,000.00 | 1,184,000.00 | - |
| | එකතුව | **6,646,845.42** | **6,646,845.42** | **-** |

උපලේඛනය ඊ

**පුස්තකාල තැන්පතු**

| වැඩසටහ | **31/12/2023** දිනට ශේෂය<br>රු |
|---|---|
| දර්ශන ශූරී වැඩසටහන | 149,648.5 |
| දර්ශන පති වැඩසටහන | 1,168,890.00 |
| ශාස්ත්‍රපති වැඩසටහන | 1,552,677.76 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන | 3,444,000.00 |
| එකතුව | **6,315,216.26** |

උපලේඛනය උ

## පර්යේෂණ ප්‍රදාන සහ අනෙකුත් අරමුදල්

| අංකය | ගිණුමේ නම | 1/1/2023 දිනට ආරම්භක ශේෂය (රු.) | ලැබීම් (රු.) | ගෙවීම් (රු.) | 31/12/2023 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| 1 | Norpart ව්‍යාපෘතිය | 263,711.24 | - | 263,711.24 | - |
| 2 | අධ්‍යක්ෂවරුන්ගේ වැය ශීර්ෂය | 336,195.21 | 410,541.39 | 67,500.00 | 679,236.60 |
| 3 | SEDRIC ව්‍යාපෘතිය | 8,418,940.00 | - | 1,240,000.00 | 7,178,940.00 |
| 4 | UN4DRR Erasmus+ ව්‍යාපෘතිය | 7,256,982.72 | 778,650.69 | 8,035,633.41 | - |
| 5 | බහු මට්ටමේ ඉගැන්වීමේ වැඩමුළුව (නව) | 132,096.00 | 646,400.00 | 778,496.00 | - |
| 6 | ජාතික භාෂා සමානාත්මතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය (නව) | 163,298.91 | 11,565,507.77 | 10,537,396.28 | 1,191,410.40 |
| | එකතුව | **16,571,224.08** | **13,401,099.85** | **20,922,736.93** | **9,049,587.00** |

උපලේඛනය ඌ

**අනෙකුත් ලැබීම්**

| අංකය | අයිතමය | වටිනාකම රු. |
|---|---|---|
| 1 | සහතිකපත්‍ර ගාස්තුව | 760,750.00 |
| 2 | භාණ්ඩ අලෙවිය (කඩදාසි, ටී-ෂර්ට්, බෑග්) | 27,730.00 |
| 3 | වෙනත් ආදායම් (හැඳුනුම්පත් ගාස්තු ආදිය) | 611.92 |
| 4 | ටෙන්ඩර් ගාස්තු | 10,000.00 |
| 6 | ඉදිරිපත් නොකළ චෙක්පත් | 54,168.00 |
| එකතුව | | **853,259.92** |

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**2023** *දෙසැම්බර්* **31** *වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අයවැයගත සහ තත්‍ය අගයන් සැසඳීමේ ප්‍රකාශය*

| දෙසැම්බර් *31* වන දිනෙන් අවසන් වූ වසර සඳහා | *2022*<br>තත්‍ය<br>රු. | *2023*<br>තත්‍ය<br>රු. | *2023*<br>අයවැයගත<br>රු. | *2023*<br>වෙනස<br>රු. |
|---|---|---|---|---|
| ආදායම | | | | |
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන | 19,654,000.00 | - | - | - |
| පුනරාවර්තන ප්‍රදාන - මාරු කිරීම් | - | 1,282,549.81 | - | (1,282,549.81) |
| ස්වයං මූල්‍ය වැඩසටහන්වල ආදායම | 128,086,521.69 | 140,782,969.88 | 130,000,000.00 | (10,782,969.88) |
| විවිධ ආදායම් | 21,365,585.65 | 53,648,346.05 | 12,800,000.00 | (40,848,346.05) |
| ප්‍රාග්ධන ප්‍රදාන - මාරු කිරීම් | 1,309,280.00 | 12,969,475.86 | - | (12,969,475.86) |
| මුළු ආදායම | **170,415,387.34** | **208,683,341.60** | **142,800,000.00** | **(65,883,341.60)** |
| වියදම | | | | |
| පුද්ගල පඩිනඩි | (69,777,746.43) | (68,038,688.61) | (71,733,000.00) | (3,694,311.39) |
| ගමන් වියදම් | (40,000.00) | (60,082.00) | (1,500,000.00) | (1,439,918.00) |
| සැපයුම් සහ පාරිභෝජ්‍ය | (2,113,789.75) | (3,305,205.20) | (6,460,000.00) | (3,154,794.80) |
| නඩත්තු | (920,230.00) | (1,404,901.23) | (2,000,000.00) | (595,098.77) |
| කොන්ත්‍රාත් සේවා | (9,221,306.92) | (10,090,212.85) | (14,990,000.00) | (4,899,787.15) |
| වෙනත් පුනරාවර්තන වියදම් | (20,111,529.59) | (19,895,619.58) | (26,117,000.00) | (6,221,380.42) |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | (9,213,012.38) | (11,434,191.26) | - | 11,434,191.26 |
| මුළු වියදම් | **(111,397,615.07)** | **(114,228,900.73)** | **(122,800,000.00)** | **(8,571,099.27)** |
| කාල සීමාව තුළ මුළු අතිරික්තය / (හිඟය) | **59,017,772.27** | **94,454,440.87** | **20,000,000.00** | **(74,454,440.87)** |

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**2023** *දෙසැම්බර්* **31** *වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශේෂ පත්‍රය*

| විස්තරය | ලෙජර් අංකය | හර රු. | බැර රු. |
|---|---|---|---|
| මා.ශා. හා ස.වි. ප.උ. ආයතනයේ පර්යේෂණ සහ අරමුදල් ගිණුම - බැංකු ගිණුම | 1 | 8,645,935.00 | - |
| ලැබිය යුතු නිබන්ධන පංති ගාස්තු | 2 | 126,368,196.45 | - |
| ලැබිය යුතු පොලිය | 3 | 6,620,130.84 | - |
| ලැබිය යුතු - පර්යේෂණ ප්‍රදාන | 4 | 778,650.69 | |
| ආපසු ගෙවිය යුතු ඉන්ධන තැන්පත | 5 | 40,000.00 | - |
| තොග ගිණුම - ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 6 | 4,030,431.10 | - |
| ටී-ෂර්ට් තොගය | 7 | 4,550.00 | - |
| බෑග් තොගය | 8 | 25,480.00 | - |
| ආපදා ණය | 9 | 1,949,998.00 | - |
| ස්ථාවර තැන්පතු | 10 | 251,160,403.32 | - |
| ගොඩනැගිලි | 11 | 9,459,415.34 | - |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 12 | 7,084,002.00 | - |
| කාර්යාල උපකරණ | 13 | 39,379,720.50 | - |
| රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ | 14 | 20,381,060.00 | - |
| සමුච්චිත ක්ෂයවීම්-ගොඩනැගිලි | 15 | - | 1,531,128.11 |
| සමුච්චිත ක්ෂයවීම් - ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් | 16 | - | 1,416,800.40 |
| සමුච්චිත ක්ෂයවීම්-කාර්යාල උපකරණ | 17 | - | 10,969,550.67 |
| සමුච්චිත ක්ෂයවීම්-රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ | 18 | - | 7,014,091.72 |
| විලම්භිත ආදායම | 19 | - | 6,646,845.42 |
| පුස්තකාල තැන්පතු | 20 | - | 6,315,216.26 |
| ගෙවිය යුතු - පුස්තකාල ගාස්තු | 21 | - | 165,556.74 |
| ගෙවිය යුතු - පේරාදෙණිය විශ්වවිද්‍යාලයට | 22 | - | 298,566.22 |
| ගෙවිය යුතු - සැපයුම් ණයහිමියෝ | 23 | - | 400,281.53 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු - ටෙන්ඩර් | 24 | - | 23,397.60 |
| ගෙවිය යුතු - බදු | 25 | - | 72,056.97 |
| උපචිත වියදම් | 26 | - | 11,988,413.29 |
| විශේෂ සේවා වෘත්තීය සහ අනෙකුත් ප්‍රතිපාදන (විගණන ගාස්තු) | 27 | - | 580,750.00 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 28 | - | 6,457,481.00 |
| වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන | 29 | - | 18,313,086.62 |
| පුනරාවර්තන ප්‍රදාන - මාරුවීම් | 30 | - | 1,282,549.81 |
| ප්‍රාග්ධන ප්‍රදාන - මාරු කිරීම් | 31 | - | 12,969,475.86 |
| සමුච්චිත අරමුදල් ගිණුම | 32 | - | 237,987,190.02 |
| උත්පාදිත අරමුදල්වලින් ප්‍රාග්ධන ප්‍රතිපාදන සඳහා දායකත්වය | 33 | - | 39,604,353.44 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 34 | - | 22,639,179.36 |
| අධ්‍යක්ෂවරුන්ගේ වැය ශීර්ෂය | 35 | - | 679,236.60 |
| NLEAP ව්‍යාපෘතිය | 36 | - | 1,191,410.40 |
| SEDRIC ව්‍යාපෘතිය | 37 | - | 7,178,940.00 |
| ලියාපදිංචි කිරීමේ ගාස්තු | 38 | - | 4,061,519.11 |
| පාඨමාලා ගාස්තු | 39 | - | 134,914,205.10 |
| විභාග ගාස්තු | 40 | - | 67,500.00 |
| ආයෝජන වලින් ලද පොලිය | 41 | - | 52,713,740.40 |
| ආපදා ණය සඳහා පොලිය | 42 | - | 81,228.04 |
| පරිගණක ණය සඳහා පොලිය | 43 | - | 96.25 |
| කාර්ය මණ්ඩල ණය පොලිය | 44 | - | 21.44 |
| අයදුම්පත් ගාස්තු | 45 | - | 1,739,745.67 |
| වෙනත් ලැබීම් | 46 | - | 853,259.92 |
| වැටුප් සහ වේතන | 47 | 14,132,985.20 | - |
| විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | 48 | 989,877.92 | - |
| විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල | 49 | 1,130,757.99 | - |
| සේවක අර්ථසාධක අරමුදල | 50 | 938,461.17 | - |
| සේවක භාර අරමුදල | 51 | 665,074.99 | - |
| රු. 5,000/- ක මාසික දීමනාව | 52 | 1,478,696.93 | - |

| විස්තරය අංකය | ලෙජර් | හර රු. | බැර රු. |
|---|---|---|---|
| අධ්‍යයන දීමනාව | 53 | 2,596,212.00 | - |
| ජීවන වියදම් දීමනාව | 54 | 2,535,000.00 | - |
| පර්යේෂණ දීමනාව (අධ්‍යයන) | 55 | 560,910.01 | - |
| අතිරේක දීමනාව | 56 | 1,523,121.68 | - |
| මාසික වන්දි දීමනාව | 57 | 2,705,853.78 | - |
| අතිකාල | 58 | 1,486,769.19 | - |
| නිවාඩු දින ගෙවීම් | 59 | 105,039.75 | - |
| ඉන්ධන දීමනාව | 60 | 434,020.00 | - |
| ප්‍රවාහන දීමනාව | 61 | 600,000.00 | - |
| සංග්‍රහ දීමනාව | 62 | 176,286.00 | - |
| ඡායා පිටපත් දීමනාව | 63 | 4,200.00 | - |
| භාහිර දේශන ගාස්තු | 64 | 33,421,183.00 | - |
| පාරිතෝෂික | 65 | 2,554,239.00 | - |
| ගමන් වියදම් (දේශීය) | 66 | 60,082.00 | - |
| සැපයුම් සහ අවශ්‍යතා - ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 67 | 2,420,684.50 | - |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 68 | 823,823.20 | - |
| සැපයුම් සහ අවශ්‍යතා - වෙනත් | 69 | 60,697.50 | - |
| පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ - නඩත්තුව | 70 | 1,404,901.23 | - |
| ප්‍රවාහන ගාස්තු | 71 | 522,227.57 | - |
| විදුලි සංදේශ ගාස්තු | 72 | 3,168,968.94 | - |
| තැපැල් ගාස්තු | 73 | 264,357.75 | - |
| විදුලිය | 74 | 609,367.50 | - |
| ජලය | 75 | 27,765.00 | - |
| කුලී ගාස්තු | 76 | 2,019,252.34 | - |
| ආරක්ෂක ගාස්තු | 77 | 1,107,455.75 | - |
| පිරිසිදු කිරීමේ සේවා | 78 | 1,404,450.00 | - |
| මුද්‍රණ සහ වෙළඳ දැන්වීම් | 79 | 966,368.00 | - |
| ක්ෂයවීම් - ගොඩනැගිලි | 80 | 401,935.54 | - |
| ක්ෂයවීම් - ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 81 | 708,400.20 | - |
| ක්ෂයවීම් - කාර්යාල උපකරණ | 82 | 6,473,924.79 | - |
| ක්ෂයවීම් - රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ | 83 | 3,849,930.73 | - |
| විශේෂ සේවා සභාව සහ රැස්වීම | 84 | 1,168,100.00 | - |
| විශේෂ සේවා වෘත්තීය සහ අනෙකුත් ක්‍රියාකාරකම් | 85 | 3,031,482.09 | - |
| වැඩමුළු සහ සම්මන්ත්‍රණ ගිණුම | 86 | 3,687,525.90 | - |
| කාර්ය මණ්ඩල සංවර්ධනය | 87 | 61,815.00 | - |
| සේවක සුභසාධනය සහ වෛද්‍ය ආධාර | 88 | 93,600.00 | - |
| වෙනත් සංවිධාන සඳහා ප්‍රදාන | 89 | 911,391.00 | - |
| නිවාඩු දින අවසර පත්‍ර සහ වාර ප්‍රවේශපත්‍ර | 90 | 252,950.00 | - |
| සංග්‍රහ වියදම් | 91 | 2,366,589.35 | - |
| සම්මාන සහ වන්දි | 92 | 1,233,719.00 | - |
| විභාග වියදම් | 93 | 7,079,617.24 | - |
| වෙනත් පුනරාවර්තන වියදම් | 94 | 8,830.00 | - |
| | | | - |
| **එකතුව** | | **590,156,873.97** | **590,156,873.97** |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීපීසී/කේඩී/ඩී/පීජීඅයිඑච්එස්/2024/02 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2024 මැයි 10 දින

අධ්‍යක්ෂ
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

පශ්චාත් උපාධි පාඨමාලා 06 කට අදාළව එම පාඨමාලාවන් සම්පූර්ණ කිරීමට ලබා දී ඇති උපරිම කාල සීමාව තුළ ලැබී නොතිබුණු රු.6,002,022 ක් වූ පාඨමාලා ගාස්තු ආදායම ආයතනයේ ආදායම් ප්‍රතිපත්තියට අනුව ලියා හැරීම සිදු නොකර ලැබිය යුතු පාඨමාලා ගාස්තු ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබීම හේතුවෙන් ලැබිය යුතු පාඨමාලා ගාස්තු ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් නිර්ණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව නිර්ණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූෂ්‍යසන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති ඡේදය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| **නීතිරීති/ විධානයට යොමුව** | **නිරීක්ෂණ** |
| --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 570 හා 571. | පාඨමාලා සම්පූර්ණ කළයුතු උපරිම කාල සීමාව ඉක්මවා තිබුණු එහෙත් පාඨමාලා සම්පූර්ණ කර නොමැති සිසුන්ගෙන් අය කළ රු.2,605,260ක |

5

ආපසු ගෙවිය යුතු පුස්තකාල තැන්පතු ආපසු ගෙවීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

| බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට යොමුව | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | 2018 මැයි 18 දිනැති අංක UGC/L/2020 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ ලිපිය | සියලුම පශ්චාත් උපාධි ආයතනවල කළමනාකරණ මණ්ඩලයේ සම්පූර්ණ සාමාජිකත්වය උපරිම සමාජිකයින් 11 දෙනෙකුට සීමා කළයුතු බව දක්වා තිබුණද, ඒ අනුව කටයුතු නොකර සාමාජිකයින් 35 දෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් පත්කර තිබුණි. මෙ හේතුවෙන් 2019 ජනවාරි සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් සඳහා එකතුව රු. 1,986,000 ක අමතර වියදමක් සහභාගිත්ව දීමනා වෙනුවෙන් දැරීමට සිදුවී තිබුණි. |
| (ආ) | 2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතනික චක්‍රලේඛය | උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර විභාග පවත්වා මාස 03 ක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කළයුතු වුවත්, ආයතනයේ පසුගිය අධ්‍යයන වසර 03 ක විභාග පවත්වා ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 04 සිට මාස 12 දක්වා කාලයක් ගතවී තිබුණි. |

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

---

(අ) ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමේදී මූල්‍ය ආයතන මගින් පොලී අනුපාත පිළිබඳව මිල ගණන් කැඳවීමකින් තොරව හා වෙළඳපල පොලී අනුපාතයන්හි විචලනයන් පිළිබඳ විචක්ෂණශීලීව කටයුතු කිරීමකින් තොරව එකී බැංකුවේම ස්වයංක්‍රීයව යාවත්කාලීන කිරීම හේතුවෙන් 2022/2023 වර්ෂය තුළ ආයතනයට උපයාගත හැකිව තිබුණු රු.7,226,709 ක පමණ පොලී ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) සේවා අවශ්‍යතාවය අනුව සේවක සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමකින් තොරව අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 26 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළ රු.6,791,161 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ඇ) ආයතනයේ විදුලි ජනන යන්ත්‍ර කාමරය ඉදිකිරීම සඳහා 2021 වර්ෂයේදී රු.1,310,562ක ඇස්තමේන්තුව පිළියෙල කිරීමේදී ගොඩනැගිලි ප්‍රමාණ මිල ගණන් (BSR) අනුගමනය කර නොතිබුණු අතර ඉදිකිරීම කටයුතු 2023 වර්ෂය දක්වා ප්‍රමාද කිරීම හේතුවෙන් මුල් ඇස්තමේන්තුව මෙන් තුන් ගුණයක් එනම් රු.3,909,538ක් වැය කිරීමට සිදුවී තිබුණි. විශ්වවිද්‍යාලය තුළ ඉතා අඩු පිරිවැයක් යටතේ මෙම විදුලි ජනන යන්ත්‍ර කාමර ඉදිකර තිබියදී අවශ්‍යතාවය නිශ්චිතව හඳුනා ගෙන කටයුතු නොකිරීම හේතුවෙන් ආර්ථිකමය නොවන කාර්යයක් වෙනුවෙන් රු.2,598,976 ක මුදලක් වැඩිපුර දැරීමට සිදු වී තිබුණි.

(ඈ) සිසුන් 36 දෙනෙකුගෙන් ලැබිය යුතුව තිබුණු රු.854,574ක හිඟ පාඨමාලා ගාස්තු අයකර ගැනීමකින් තොරව අවසන් විභාගය සඳහා පෙනී සිටීමට අවස්ථාව ලබාදී තිබුණු අතර සිසුන් 12 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබුණු රු.255,500ක හිඟ පාඨමාලා ගාස්තු අයකර ගැනීමකින් තොරව ඔවුන් වෙත උපාධි සහතික පත්‍ර ප්‍රදානය කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

7

| 18 වනකොටස | **විගණකාධිපතිවරයාගේ වාර්තාව සඳහා ආයතනය විසින් ලබා දුන් පිළිතුර** |
|---|---|

**POSTGRADUATE INSTITUTE OF HUMANITIES AND SOCIAL SCIENCES (PGIHS)**
University of Peradeniya, Peradeniya 20400, Sri Lanka

2024 අගෝස්තු 28

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති කාර්යාලය,
දිස්ත්‍රික් මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
යටිනුවර වීදිය, මහනුවර

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුලත්ව එහි කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කරන විස්තරාත්මක විගණකාධිපති වාර්තාව

ඔබ විසින් ඉදිරිපත්කළ 2024/05/31 දිනැති අංක CPCG/KD/D/PGIHS/2024/02 දරන විස්තරාත්මක විගණකාධිපති වාර්තාව_සම්බන්ධයෙන් තවදුරටත් කරුණු පැහැදිලි කිරීම සඳහා මෙම පිළිතුරු ඉදිරිපත් කරනු ලබන අතර පිළිතුරු සනාථ කිරීමට ප්‍රමාණවත් ලිපිලේඛන, වාර්තා සටහන් යනාදියෙහි පිටපත් මේ සමඟ අමුණා ඇත.

1.4

1.4.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

(අ) මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් 2022 වර්ෂය තුළ තිබුනු වත්කම් ප්‍රත්‍යාගණනය කොට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුනි. 2022 වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම් යටතේ දේපල පිරියත හා උපකරණ, ප්‍රත්‍යාගණිත අගය මත දක්වා ඇති බව දක්වා ඇත. 2023 වර්ෂය තුළ කිසිදු ස්ථාවර වත්කමක් ප්‍රත්‍යාගණනය නොකළ බැවින් මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොමැත. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ප්‍රමිතවලට අනුකූලව ඉදිරියේදී මෙය හෙළිදරව් කිරීමට කටයුතු යොදනු ලැබේ.

(ආ) 2023 වසර තුළ මිලදී ගත් සියළු වත්කම් මුදල් ප්‍රවාහ ප්‍රකාශ තුළ ආයෝජන ක්‍රියාකාරකමක් ලෙස දක්වා ඇති බැවින් පරිත්‍යාග ලෙස ලද වත්කම් මිලදී ගැනීමද ආයෝජන ක්‍රියාකාරකමක් ලෙස දක්වා ඇත. මෙම තත්වය 2024 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

1.4.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) පාරිතෝෂික අරමුදල් ගණනය කිරීමේදී සිදුවූ අත්වැරදීමක් මත රු. 19,262.00 ක් අඩුවෙන් ගණනය වී ඇත. මෙම තත්වය 2024 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) පශ්චාත් උපාධි පාඨමාලා සම්පූර්ණ කිරීමට ලබා දී ඇති උපරිම කාල සීමාව තුළ නොලැබුණු පාඨමාලා ගාස්තු තුළින් රු. 6,415,669.00 ක් විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත හා ආයතනයේ කළමනාකරණ කමිටුවේ අනුමැතිය මත මූල්‍ය ප්‍රකාශන තුළින් ඉවත් කර ඇත.

තවද මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත්කිරීමට පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය වෙත ඉදිරිපත් කළ ලිපිගොනු අතරින් 2023 දෙසැම්බර් 31 දින වන විට අභ්‍යන්තර



Office: +94812 068 363 Director: +94 812 068 364 SAR/AR: +94 812 388 957 SAB/AB: +94 812 068 361
Fax: +94 812 068 362 Web: pgihs.ac.lk email: info@pgihs.ac.lk

විගණන අංශය විසින් පරීක්ෂා කළ ලිපි ගොනු වලට අයත් සිසුන්ගේ පාඨමාලා ගාස්තු වශයෙන් රු. 1,508,750.00ක් විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත හා ආයතනයේ කළමනාකරණ කමිටුවේ අනුමැතිය මත මූල්‍ය ප්‍රකාශන තුළින් ඉවත් කර ඇත. එසේම අභ්‍යන්තර විගණන අංශය විසින් පරීක්ෂා නොකළ සහ පරීක්ෂා කිරීම සඳහා මෙතෙක් ඉදිරිපත් නොකළ ලිපිගොනු වලට අයත් පාඨමාලා ගාස්තු අදාළ පරීක්ෂා කිරීම් වලින් අනතුරුව 2024 වසර තුළ පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

1.5 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

(අ)

i. පාඨමාලා සම්පූර්ණ කළයුතු උපරිම කාල සීමාව ඉක්මවා ඇති සිසුන්ගේ ශිෂ්‍යභාවය අහෝසි කිරීමට මේ වන විට ආයතනය සෑම වර්ෂයකදීම කටයුතු සිදු කරනු ලබයි. එසේ ශිෂ්‍යයභාවය අවසන් කරනු ලබන සිසුන් හට ආයතනය විසින් ඔවුන් වෙත නිකුත් කර ඇති ශිෂ්‍යය හැඳුනුම්පත සහ පුස්තකාලය මඟින් ඔවුන් වෙත නිකුත් කර ඇති පොත් ලබා ගැනීමේ කාඩ්පත් නැවත ආයතනය වෙත ලබා දෙන ලෙස ආයතනය විසින් ලිපියක් මඟින් අදාල සිසුන් දැනුවත් කර ඇත.

සාමාන්‍යයෙන් සිසුන් ශිෂ්‍ය හැඳුනුම්පත සහ පුස්තකාලය මඟින් පොත් ලබා ගැනීමේ කාඩ්පත් නැවත ආයතනය වෙත ලබා දුන් විට සහ පුස්තකාලය වෙත යම් කිසි හිඟ මුදලක් ගෙවීමට ඇත්නම් එයද ගෙවා අවසන් කළ විට ඔවුන්ගේ තැන්පතු නිරවුල් කිරීමට ආයතනය කටයුතු කරනු ලැබේ. ශිෂ්‍යභාවය අහෝසිකළ සිසුන්ගේ තොරතුරු ප්‍රධාන පුස්තකාලය වෙත ලබා දී ඔවුන්ගේ නිර්දේශ මත ආයතනයේ කළමනාකරණ කමිටු අනුමැතිය ලබා ගෙන 2024 වසර තුළ අදාළ මුදල රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ.

ii. 2022 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙන් හඳුනා ගන්නා ලද බැහැර කිරීමට යෝජිත අයිතමයන් බැහැර කිරීම සඳහා නිර්දේශයන් ලබා දීමට කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය පරිදි පත්කරන ලද කමිටුව මේ වන විටත් අදාළ නිර්දේශයන් ආයතනය වෙත ලබා දී ඇත. අදාළ කමිටු වාර්තාවේ අඩංගු නිර්දේශයන්ට අනුකූලව වෙනත් ආයතනයන් වෙත ප්‍රදානය කළ හැකි අයිතමයන් වෙනත් ආයතන වලට ලබා දීමට අදාළ කටයුතු මේ වන විට සිදු කර ඇති අතර අදාළ අනෙකුත් බැහැර කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා මේ වන විටත් සියලු ක්‍රියාමාර්ග ගෙන ඇත.

iii. මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව ආයතනයේ ඇප තැන්පත් කළ යුතු නිලධාරීන් අතරින් ආයතනයේ ගබඩාව භාරව සිටින නිලධාරියා ඇප තැන්පත් කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි. මේ පිළිබඳව 2023 දෙසැම්බර් මස 21 දින පැවති ආයතනයේ 27 වන විගණන හා කළමනාකරණ කමිටුවේදී ද දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ අතර මෙහිදී ලබාගත් තීරණයන් අනුව ගබඩා භාරකරු අදාල ඇපය තැන්පත් කිරීමට අපොහොසත් වන්නේ නම් අදාල විෂය අදාල නිලධාරියාගෙන් ඉවත් කර වෙනත් නිලධාරියෙකු වෙත පැවරීමට තීරණය විය. කෙසේ වුවත් දැනට ගබඩා භාරකරු ලෙස සේවය කරන ඒ. එම්. එල්. අබේකෝන් මහතා සමග සිදුකල දීර්ඝ සාකච්ඡාවෙන් පසු ගබඩා භාරකරු වශයෙන් දිගටම සේවය කිරීමටත් නියමිත පරිදි ඇපය තැබීමටත් එකඟ විය. මේ අනුව ඔහුගෙන් අවශ්‍ය ඇප තැන්පතුව ලබා ගැනීමට අවශ්‍යය කටයුතු ආයතනය විසින් මේ වන විට සිදු කරගෙන යනු ලබයි.

(ආ)

i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක UGC/L/2020 හා 2018 මැයි 18 දිනැති චක්‍රලේඛ ලිපි ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් ආයතනයේ කළමනාකරණ මණ්ඩලය වෙත 2018

අගෝස්තු 31 වන දින පැවති ආයතනයේ 21 වන කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී ඉදිරිපත් කරන ලදී. මෙහිදී කළමනාකරණ මණ්ඩලයේ තීරණයන් 2019 ජනවාරි මස 29 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා (නියමාවලිය සංශෝධනය වැනි) ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් යොමු කරනු ලැබිණි. අදාල කටයුතු සිදු වෙන තුරු බල පවත්නා ආයතනයේ නියමාවලිය අනුව (චක්‍රලේඛයට වඩා නීතිමය බලයක් නියමවලියට ඇති නිසා) ආයතනයේ කළමනාකරණ මණ්ඩල සාමාජිකත්වය සම්බන්ධයෙන් කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. (ඇමුණුම 01)

ii. අදාළ අධ්‍යයන වර්ෂයන් වලට අදාළ ප්‍රතිඵල නිකුත් කිරීමට සාමාන්‍යයෙන් වැඩි කාලයක් ආයතනය විසින් ලබාගත් බව සත්‍යයකි. මෙයට හේතුව වූයේ 2020/2021 වර්ෂයන් වල පැවති කොවිඩ් වසංගත තත්ත්වය සහ 2021/2022 වර්ෂයන් වල පැවති ආර්ථික අර්බුදය මත පාඨමාලාවන්හි අවසන් විභාග කල් යෑම හෝ අදාළ විභාගයන් මාර්ගගත ආකාරයට පැවැත්වීමට ආයතනයට සිදු වීමයි. මෙම හේතුව නිසා උත්තර පත්‍ර ඇගයීම සැලකිය යුතු කාලයකින් දීර්ඝ වූ අතර අදාළ ප්‍රතිඵල නිකුත් කිරීම 2023 වර්ෂය තුළදී සිදු විය.

මෙම ප්‍රතිඵල ප්‍රමාදයට හේතු වූ කරුණු සහ ප්‍රතිඵල නිකුත් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳවත් නැවත මෙවැනි තත්වයන් ඇතිවීම වැලක්වීමට ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳවත් 2023 දෙසැම්බර් මස 29 වන දින පැවති ආයතනයේ 51වැනි කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී සහ 2024 පෙබරවාරි මස 26 වන දින පැවති ආයතනයේ 52වැනි කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කල අතර අදාළ තීරණයන් අනුව ඉදිරියේදී ආයතනය විසින් කටයුතු සිදු කරනු ලබයි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ)

- Postgraduate Diploma in Accountancy සහ Postgraduate Diploma in Management යන පාඨමාලාවන් 2019/2020 අධ්‍යයන වර්ෂයේදීද පවත්වා ඇති බව දන්වා සිටිමි. මෙම පාඨමාලාවන් මේ වන විට පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පීඨයේ පශ්චාත් උපාධි අංශය විසින්ද පිරිනමනු ලබන අතර මේ හේතුව නිසා මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් මේ වන විට මෙම පාඨමාලා පිරිනැමීම අත්හිටුවා ඇත. කෙසේ වෙතත් අසමත් වීම මත හෝ වෙනත් හේතූන් මත නැවත වරක් විභාගය වෙනුවෙන් පෙනී සිටින සිසුන් වෙනුවෙන් අදාළ අවසන් පරීක්ෂණ ලබා දීම තව දුරටත් සිදු කරනු ලබයි.

- Executive Diploma in Taxation පාඨමාලාව 2019 දෙසැම්බර් මසදී ආරම්භ කිරීම සඳහා අයදුම්පත් කැඳවූවද ඒ සඳහා ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබීම මත අදාළ පාඨමාලාව ආරම්භ කිරීමට නොහැකි විය. ආයතනය නැවත වරක් අදාළ පාර්ශවකරුවන් සමඟ රැස්වීම් වාර කිහිපයක් පැවැත්වීමෙන් පසු (Stakeholder meetings) අදාළ පාඨමාලාව සඳහා නැවත වරක් අයදුම්පත් කැඳවීමට සැලසුම් කරමින් පවතී.

- අවසාන වශයෙන් සිසුන් ඇතුලත් කරගත් Postgraduate Diploma in Physical Education පාඨමාලාව වූයේ 2021/2022 අධ්‍යයන වර්ෂයයි. මෙම අධ්‍යයන වර්ෂයට අදාළ අධ්‍යයන කටයුතු අවසන් වූයේ 2023 ජූලි මස 18 වන දිනයි. මේ වන විට 2025 අධ්‍යයන වර්ෂයට සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා අයදුම්පත් කැඳවා ඇත.

- Postgraduate Diploma in Community Development and Planning පාඨමාලාව 2020 ජූලි මසදී ආරම්භ කිරීම සඳහා අයදුම්පත් කැඳවූවද ඒ සඳහා ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබීම මත අදාළ පාඨමාලාව ආරම්භ කිරීමට නොහැකි විය. ඉන් පසුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුම්ගත වීමෙන් පසු 2021 පෙබරවාරි මසදී පාඨමාලාව ආරම්භ කිරීම සඳහා නැවත අයදුම්පත් කැඳවනු ලැබූ අතර 2021 නොවැම්බර් 06 වන දින 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා පාඨමාලාව අරඹනු ලැබිණි. මේ වන විට අදාළ පාඨමාලාවේ සියලු අධ්‍යයන කටයුතු සහ විභාග කටයුතු අවසන්ව ඇති අතර සිසුන් ඔවුන්ගේ පර්යේෂණයේ අවසන් අදියරයේ කටයුතු වල නිරත වේ. මෙම අධ්‍යයන වර්ෂයේ සිසුන්ගේ සියලු අධ්‍යයන කටයුතු අවසන් වූ විගස නව අධ්‍යයන වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීමට ආයතනය අරමුණු කරගෙන සිටියි.

- Master of Social Work පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබුවේ 2019 අගෝස්තු 15 දින වන අතර 2020 මාර්තු මස 01 වන දින පාඨමාලාව ආරම්භ කෙරිණි. අදාළ පාඨමාලාව හා සම්බන්ධ ආචාර්යවරුන්ගේ සේවය ලබාගැනීමේදී සිදු වූ දුෂ්කරතාවය මත පාඨමාලාව අවසන් කිරීමේ කාලය දීර්ඝ වූ අතර මේ වන විට අදාළ පාඨමාලාවේ සියලු අධ්‍යයන කටයුතු සහ විභාග කටයුතු අවසන්ව ඇති අතර සිසුන් ඔවුන්ගේ පර්යේෂණයේ අවසන් අදියරයේ කටයුතු වල නිරත වේ. මෙම පාඨමාලාව ක්ෂේත්‍ර වැඩමුළු හා බැඳී පවතින අතර 2020/2021 වර්ෂයේ පැවති කොවිඩ්-19 තත්වය මත එම වැඩමුළු පවත්වාගැනීම අසීරු විය. මේ හේතුවෙන් ද පාඨමාලාව අවසන් කිරීමේ කාලය දීර්ඝ විය. කෙසේ නමුත් මේ වන විට 2025 අධ්‍යාන වර්ෂය සඳහා අයදුම්පත් කැඳවා ඇත.

- Master of Education පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබුවේ 2019 අප්‍රේල් මස 28 දින බව සත්‍යයකි. මෙම අයදුම්පත් කැඳවීමේදී අදාළ පාඨමාලාව සඳහා අයදුම්පත් 404ක ප්‍රමාණයක් ලැබුණු අතර එයින් සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් 100ක පමණ පිරිසක් 2019/2020 කණ්ඩායම ලෙස 2020 ජනවාරි 07 දින ඇතුලත් කර ගනු ලැබිණි. 2019/2020 කණ්ඩායම පාඨමාලාව අවසන් කිරීමෙන් පසුව එම අයදුම්කරුවන් අතරින්ම නැවත සිසුන් 100ක පමණ ප්‍රමාණයක් 2022/2023 කණ්ඩායම ලෙස 2022 අප්‍රේල් මස 30 දින ඇතුලත් කර ගනු ලැබිණි. අදාළ කණ්ඩායමද මේ වන විට ඔවුන්ගේ අධ්‍යයන කටයුතු අවසන් කර ඇති අතර 2024 පෙබරවාරි මස 15 වන දින නවක සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පළකරන ලදී.
  කෙසේ වෙතත් මේ වන විට පාඨමාලාවල විෂයමාලා ප්‍රතිශෝධනයක් පවත්වාගෙන යනු ලබන අතර ඉන් අනතුරුව සිසුන් ලියාපදිංචි කිරීමට විධිමත් වැඩ පිළිවෙලක් ස්ථාපිත කරනු ඇත.

(ආ)

මෙම අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් පහත දැක්වෙන පියවරයන් මේ වන විටත් ලබාගෙන ඇත.

- මෙම හිඟ මුදල් අයවිය යුතු සිසුන් ආයතනයේ නව අතුරු නීති (By Lawas) 2019 ජූලි මසදී අනුමත වී ක්‍රියාත්මක කිරීමට පෙර ලියාපදිංචි වූ සිසුන් වේ. 2019 ජූලි මසදී අනු නීති ක්‍රියාත්මක කිරීම සහ 2021 වර්ෂයේදී ආයතනයේ ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය හඳුන්වා දීමෙන් පසුව ආයතනය ශිෂ්‍යයන්ගෙන් ලැබිය යුතු පාඨමාලා ගාස්තු අදාළ ශිෂ්‍යයන්ගේ නියමිත පාඨමාලා කාලය අවසන් වීමට ප්‍රථම ලබා ගැනීම සඳහා ආයතනය ඉතා විධිමත් ක්‍රියා පිළිවෙතක් හඳුන්වා දී ඇති අතර මේ වනවිට එය නිවැරදිව ක්‍රියාත්මක වේ.
- එසේම අදාළ පාඨමාලා ගාස්තු නොගෙවන සහ නියමිත කාලය තුළදී පාඨමාලාව අවසන් නොකරන සිසුන්ගේ ශිෂ්‍යභාවය අවලංගු කිරීමටද විධිමත් ක්‍රියා පිළිවෙතක් මේ වන විට හඳුන්වා දී ඇත.

- හිඟ ගාස්තු වශයෙන් ගිණුම් වල ශේෂයක් පෙන්නුම් කර තිබියදීත් ආයතනය විසින් නිකුත් කරන විස්තරාත්මක උපාධි සහතිකපත් ලබාගෙන ඇති සිසුන්ගෙන් අදාළ මුදල් අය කර ගැනීම සඳහා මේ වන විට ආයතනය පහත සඳහන් ක්‍රියාමාර්ගයන් ගෙන ඇත.
  - මුදල් ගෙවන ලෙස දන්වා අදාළ සිසුන් වෙත දුරකතනයෙන් දැනුම්දීම.
  - මුදල් ගෙවන ලෙස දන්වා අදාළ සිසුන් වෙත සිහි කැඳවීම් ලිපි යොමු කිරීම.
  - අදාළ හිඟ මුදල් ගෙවන තෙක් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය ලියාපදිංචි කිරීමේ අංශය විසින් නිකුත් කරන විශ්ව විද්‍යාලයීය උපාධි සහතිකපත් අදාළ සිසුන් වෙත නිකුත් නොකරන ලෙස මේ වන විටත් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය ලියාපදිංචි කිරීමේ අංශය වෙත දන්වා යවා ඇත.
  - පාඨමාලා ගාස්තු ලෙස රු. 255,500.00 ගෙවීමට ඇති මුත් අදාළ සහතිකපත් ලබා ගත් සිසුන්ට ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ආයතනයේ කළමනාකරණ මණ්ඩලය දැනුවත් කොට ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග තීරණය කිරීම.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) ආයතනය මගින් තාවකාලික මුදල් අතිරික්තයන් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමට කටයුතු කරයි. ආයතනයේ වියදම් පියවීම සඳහා මුදල් අමාත්‍යාංශයෙන් අරමුදල් ලබා නොදෙන බැවින් මාසික මුදල් අවශ්‍යතාවයන් සපුරා ගැනීමට හැකි වන පරිදි හා මාසිකව ස්ථාවර තැන්පතු කල් පිරෙන පරිදි එම මුදල් මාසික පදනමින් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කොට ඇත. පොලී ආදායම් ඉපයීමේ අරමුණින් පමණක් මෙම ස්ථාවර තැන්පතු සියල්ල වැඩි පොලී අනුපාතයක් මත එකම දිනක එකට එකතු කොට නැවත ආයෝජනය කිරීමෙන් ආයතනයේ මාසික මුදල් සපයා ගැනීමේ අරමුණ ලඟා කර ගත නොහැකි වේ. ඇතිවන මුදල් අවශ්‍යතාවයන් අනුව අවශ්‍ය ද්‍රවශීලතාවය ලබා ගැනීමට කල්පිරීමේ දිනයන්හි ව්‍යාප්තියක් අවශ්‍යව ඇති නිසා මෙලෙස එකම දිනකදී ආයෝජනය කිරීමට කටයුතු යොදා නොමැත.

තවද මෙම සෑම නැවත ආයෝජනය කිරීමක්ම සිදුව ඇත්තේ අවසරලත් රාජ්‍ය බැංකු තුනෙන් පොලී අනුපාත සඳහා මිල කැඳවීමෙන් පසුව සහ වැඩිම පොලියක් ලබා දෙන බැංකුව තේරීම සඳහා නිවැරදි ප්‍රසම්පාදනය සිදු කිරීමෙන් පසුව බව දන්වා සිටිමි.

තවද, ආයතනය විසින් වැඩි පොලී ප්‍රමාණයක් ඉපයීමේ අරමුණින් රු. මිලියන 45ක් පමණ වටිනා ස්ථාවර තැන්පතු 03ක් කල් පිරීමට පෙර එනම් 2022 දෙසැම්බර් 15වන දින ආපසු ගැනීමක් සිදු කර වැඩි පොලී අනුපාතයක් යටතේ නැවත ආයෝජනය කර ඇත.

(ආ) 2023 වසර තුල කොන්ත්‍රාත් පදනම මත ආයතනය සේවකයන් විසිහයදෙනෙකුගේ සේවය ලබාගත් බව සත්‍යයකි. නමුත් ඇතැම් සේවකයින් සේවයෙන් ඉවත්වීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 වන විට ආයතනය කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 19 දෙනෙකුගේ පමණක් සේවය ලබා ගෙන ඇත. තවද 2023 වසරේ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සියලුම සේවකයින් සේවයෙන් ඉවත්ව ගිය සේවකයින් වෙනුවෙන් ආදේශ කිරීමක් වශයෙන් බඳවා ගෙන ඇත.

ආයතනයට ඇතුලත් වන ශිෂ්‍යය සංඛ්‍යාව ඉහල යන විට සහ ආයතනික වැඩ කටයුතු පුළුල් වන විට ඒ අනුව සේවකයන් සේවයේ යෙදවිය යුතු වේ.

මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් වැඩිවන අවශ්‍යතාවයන්ට අනුරූපව නව තනතුරු හඳුනා ගත අතර ඒ අනුව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අවස්ථා කීපයකදීම සිය කාර්යමණ්ඩල තනතුරු අනුමත කරවා ගැනීම වෙනුවෙන් ඉල්ලීම් සිදු කර ඇත. (ඇමුණුම 02) නමුත් දැනට ඒ වෙනුවෙන් යහපත් ප්‍රතිචාරයක් අදාළ ආයතන වලින් ලැබී නොමැති අතර අදාළ තනතුරු අනුමත වී ආයතනය විසින් එම තනතුරු සඳහා ස්ථිර කාර්ය මණ්ඩලය බඳවා ගන්නා තෙක්

විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛ 2016/04 අනුව ඉහත සේවකයන් කොන්ත්‍රාත් පදනම මත ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව සේවයේ යොදවා ගැනීම ආයතනය සිදු කරනු ලබයි. එසේම කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා කාර්යමණ්ඩල තනතුරු වෙනුවෙන් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍යය කටයුතුද ආයතනය විසින් මේ වන විට සිදු කරගෙන යනු ලබයි.

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

(අ) ගබඩාව තුළ ඇති චලනය නොවන තොග හා සෙමෙන් චලනය වන තොග ඉදිරියේදි මිලදි නොගන්නා ලෙස උපදෙස් ලබා දී ඇති අතර එම අයිතමයන් වෙනත් ආයතන වෙත ලබා දීමට හෝ කටයුතු කරනු ලැබේ.

(ආ) 2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙන් හඳුනා ගන්නා ලද බැහැර කිරීමට යෝජිත අයිතමයන් 37ක් අඩංගු බව සත්‍යකි. අදාළ අයිතමයන් 2024 වර්ෂය තුලදී බැහැර කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

මානවශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විදුලි ජනන යන්ත්‍ර කාමරය ඉදිකිරිම වෙනුවෙන් අවස්ථා තුනකදී ඇස්තමේන්තු සකස්කළ බව සත්‍යයකි. මෙම ඉදිකිරිම සිදු වූයේ ගොඩනැගිලි ආශ්‍රිත වියදම්වල සැලකිය යුතු වැඩි වීමක් ඇති වූ කාල පරිච්ඡේදයක් තුළ (2022) ය. මෙයට හේතු වූ කරුණු පහත දක්වා ඇත.

එසේම 2022 ඔක්තෝබර් මස 11 වන දින පැවති ආයතනයේ 50වන කළමනාකරණ මණ්ඩලයේදී තීරණය වූ පරිදි අදාළ ඇස්තමේන්තු සකස් කිරීම සඳහා ප්‍රමිත මිල ගණන් (Building Schedule Rates) අනුගමනය කර තිබුණිද යන්න විමසීමටත් අදාළ මිල වැඩිවීම් සත්‍ය වශයෙන්ම සිදුව ඇත්ද යන්නත් පිළිබඳව නිර්දේශ ලබා ගැනීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ පීඨාධිපතිවරයා වෙත යොමුකිරීමට නිර්දේශ කරන ලද අතර මේ වන විට අදාළ නිර්දේශයන් ලැබී ඇත.

| දිනය | විස්තර | මුදල (රු.) (අනපේක්ෂිත තත්ත්වයන්, මිල වැඩි කිරීම, වැට් බදු නොමැතිව) |
|---|---|---|
| 25/12/2021 BOQ – 1 | LBMC අනුමැතිය සඳහා ව්‍යාපෘති කළමනාකරු විසින් සකස් කරන ලද ඇස්තමේන්තුව (මෙය 2022/02/15 දින පැවති LBMC හි 347 වන රැස්වීමේදී අනුමත කරන ලදී) (මෙම අනුමැතිය ලබා ගැනීම විදුලි ජනක යන්ත්‍රය තෝරා ගැනීමෙන් පසුව සිදු කළ යුතු වුවද ආයතනය විසින් විදුලි ජනක යන්ත්‍රය තෝරා ගැනීමට පෙරම මෙම ක්‍රියාවලිය ආරම්භ කරනු ලැබුවේ එහිදී සිදුවන අනවශ්‍යය ප්‍රමාදවීම් මගහරවා ගැනීම සඳහා වේ.) | 1,310,562.00 |

| | | |
|---|---|---|
| 2022 මාර්තු - අගෝස්තු | විදුලි ජනක යන්ත්‍ර ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකිරීම | |
| 27/09/2022 BOQ – 2 | තෝරාගත් විදුලි ජනක යන්ත්‍රයට අනුකූලව අදාළ කාලයේ පැවති මිල ගණන් වලට අනුකූලව ව්‍යාපෘති කළමනාකරු විසින් මෙම ඇස්තමේන්තුව සකස් කරන ලද අතර මෙහිදී පිරිවැය වැඩි වී ඇත. BOQ – 2 අනුව මිල ගණන් කැඳවීම සිදු කළ අතර ලංසු ලබා දීම සඳහා වූ අවසාන දිනය 31/10/2022 විය. | 2,463,525,00 |
| 09/11/2022 BOQ – 3 | 26/10/2022 දින පෙර මිල කැඳවීම් රැස්වීම පැවති අතර සැපයුම්කරුවන් 5 දෙනෙකු මෙම රැස්වීම සඳහා සහභාගී විය. මෙහිදී BOQ හි පවතින ප්‍රයෝගික දුෂ්කරතා එම රැස්වීමට සහභාගී වී සිටි සැපයුම්කරුවන් විසින් පෙන්වා දෙන ලද අතර එයට අදාළව සිදුවිය යුතු සංශෝධනයන් ව්‍යාපෘති කළමනාකරු වෙත දන්වා සිටින ලදී. මේ අනුව අදාළ ඇස්තමේන්තුව නැවත සමාලෝචනය කළ ව්‍යාපෘති කළමනාකරු විසින් ඇස්තමේන්තුව නැවත වරක් 09/11/2022 දින සංශෝධනය කරන ලදී. මේ අනුව සැපයුම්කරුවන්ට මිල ගණන් ලබා දීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දීමට ලංසු සඳහා අවසාන දිනය 25/11/2022 දක්වා දීර්ඝ කර ඇත. | 3,289,833.50 |

ව්‍යාපෘති කළමනාකරුගේ නිර්දේශයන් මත කොන්ත්‍රාත් කාලය දීර්ඝ කල බව සත්‍යයකි. එම දීර්ඝ කිරීමට අදාළ ලිඛිත සාක්ෂි ඇමුණුම් කර ඇත.

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විදුලි ජනන යන්ත්‍ර කාමරය ඉදිකිරීමට සුදුසු ස්ථානය නිර්දේශ කරන ලද්දේ විදුලි ජනක යන්ත්‍රය මිලදීගැනීමට අදාලව ක්‍රියා කළ තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකත්වය දැරූ විදුලි ඉංජිනේරුවරයා විසිනි. (ප්‍රමාණවත් වාතාශ්‍රය හා සුදුසු භූමි පිහිටීම අනුව) මේ සඳහා ස්ථාන දෙකක් නිර්දේශ වූ අතර එයින් එක ස්ථානයක් අනාගතයේ ඉදිකිරීමට යෝජිත පරිපාලන ගොඩනැගිල්ලට නියමිත ස්ථානයේ වූ බැවින් එම ස්ථානය විදුලි ජනන යන්ත්‍ර කාමරය ඉදිකිරීමට තෝරා නොගැනුණි. දැනට විදුලි ජනන යන්ත්‍ර කාමරය ඉදිකර ඇති ස්ථානය තෝරා ගැනුනේ මේ අනුව වේ. අදාළ තෝරාගත් ස්ථානයේ විදුලි ජනන යන්ත්‍ර කාමරය ඉදිකිරීමේදී පවතින ගොඩනැගිලිවල දැනට පවතින සැළැස්මට හානියක් නොවන ලෙසත් විදුලි ජනක යන්ත්‍රයෙන් පිටවන ශබ්දයෙන් ආයතනයේ වැඩකටයුතු වලට, දේශන වලට සහ ආයතනයේ ශ්‍රවණාගාරයේ වැඩකටයුතු වලට බාධාවක් නොවන ලෙසත් එය ඉදිකිරීමට සැළසුම් කරන ලදී. මෙම කටයුතු වලට ගැලපෙන ආකාරයෙන් විදුලි ජනන යන්ත්‍ර කාමරය ඉදිකිරීම සිදුකරන ලද බව දන්වා සිටිමි.

එසේම අදාළ ප්‍රසම්පාදන කටයුතුද බොහෝදුරට නිවැරදි කාලරාමුව තුළ දී සිදුව ඇති බවද දැන්ව සිටිමි.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය අයවැය පාලනය

බැංකු මගින් පොළී ප්‍රතිශත වැඩි කිරීම හා ආයතනය විසින් නව ආයෝජනයන් සිදුකිරීම නිසා ලද පොලී ආදායම වැඩිවී ඇත. එසේම 2023 වර්ෂයේදී නව පාඨමාලා ආරම්භ කිරීමේදී ආයතනය මඟින් පාඨමාලා ගාස්තු ඉහළ නැංවීම නිසා පාඨමාලා ගාස්තු වැඩියෙන් ලැබී ඇත. තවද 2023 වර්ෂයේදී අපේක්ෂා කළ පරිදි සිසුන් පාඨමාලා සඳහා අයදුම්පත් ඉදිරිපත් නොකිරීම මත සහ පාඨමාලා සඳහා ලියාපදිංචි නොවීම මත අයදුම්පත් ගාස්තු සහ ලියාපදිංචි ගාස්තුවල අඩුවීමක් පෙන්නුම් කරයි. රටේ පැවති ආර්ථික අර්බුධය හමුවේ බහුතරයක් සිසුන් පාඨමාලා ආරම්භ කිරීම සීමා කිරීම මෙයට හේතු විය හැක.

ආයතනයේ ඇතැම් කටයුතු විවිධ බාහිර සාධක මත රඳා පවතින බැවින් එම කටයුතුවල වියදම් නිවැරදිව පුරෝකථනය කිරීමට අපහසුය. මේ නිසා අයවැයගත වියදම් හා සත්‍ය

වියදම් සමග සැසඳීමේදී යම් සත්‍ය වියදම් වල වෙනස් වීමක් දක්නට ලැබේ. මෙම කටයුතු සම්බන්ධයෙන් වඩාත් නිවැරදි පුරෝකථන කිරීමට ඉදිරියේදී කටයුතු කෙරේ.
2023 වර්ෂයේදී මෙම සත්‍ය වියදම්වල අඩුවීමක් වීමට හේතු වී ඇත්තේ ආයතනයට මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන පුනරාවර්තන සහ ප්‍රාග්ධන ප්‍රතිපාදන නොලැබීම මත ආයතනය වඩාත් සකසුරුවම් ආකාරයෙන් වියදම් කපා හරිම සඳහා කටයුතු කිරීමයි.

අධ්‍යක්ෂ,
මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

**අධ්‍යක්ෂ**
**මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා**
**පශ්චාත් උපාධි ආයතනය**
**පේරාදෙණිය විශ්ව විද්‍යාලය.**

පිටපත්:

1. ගරු මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා - කා. දැ.ස.
2. ගරු අධ්‍යාපන අමාත්‍යතුමා - කා. දැ.ස.